# පෙරවදන සහ හැඳින්වීම



**පෙරවදන** **11**

**හැඳින්වීම** 13

මාර්ටිනා ෆිෂර්, නෝබට් රෝපස්

© 2006 Berghof Research Center for Constructive Conflict Management

© 2006 Berghof Research Center for Constructive Conflict Management

# පෙරවදන

විවිධාකාර ස්වරූපයන් ගත් අර්බුද රැසකට මුහුණ දුන් අන්තර්ජාතික ප්‍රජාව ඒ සඳහා මානුෂික සහාය, සංවර්ධන ආධාර, අර්බුද වළක්වාලීම සහ අර්බුද නිරාකරණ වැඩසටහන් මාර්ගයෙන් මේ සඳහා ප්‍රතිචාර දක්වීමට උත්සාහ දරා ඇත. මෙම විවිධ ක්‍රියාමාර්ග මගින් ස්ථාවර සංවර්ධනයකට සහ සාමයකට ඇති අවස්ථා වර්ධනය කරනු මෙන්ම, අර්බුදයේ විවිධ ගතික තීරණය කිරීමට ද උත්සුක වී ඇත. නියමාකාරයෙන් සිදුවන්නේ කුමක් දැයි අවබෝධ කරගැනීම සඳහා උගත් පාඩම් මොනවා ද සහ වඩාත් යහපත් ක්‍රියාමාර්ග කවරේ ද යන කරුණු තෝරා ගැනීම සඳහා ඒවාට අදාල තොරතුරු, පෞද්ගලික ව්‍යාපෘති හෝ වැඩසටහන් තක්සේරු කිරීම් මාර්ගයෙන් එක්රැස් කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් මෙතෙක් කෙරී ඇති අධ්‍යයන සංඛ්‍යාත්මකව වැඩි වී ඇතත්, විෂය ක්ෂේත්‍රය හෝ භාවිත කරන්නන් සඳහා වඩාත් පුළුල් සාකච්ඡාවක් ඇති කරනු වස්, ක්‍රමවත්ව හෝ එකළස් කොට සකස් වී ඇති පාඩම් ස්වල්පයකි.

සාධනීය අර්බුද කළමනාකරණය සඳහා වූ බර්ගොෆ් පර්යේෂණ මධ්‍යස්ථානය මෙම අත්පොත සකස් කළේ මේ වන විටත් ප්‍රචණ්ඩකාරී අර්බුද තුළ හා ඒවා ගැන කටයුතු කරන පුද්ගලයින්ට මුහුණ දෙන්නට සිදුවන විවිධාකාර වූ අභියෝගයන්ට ප්‍රතිචාර වශයෙනි. විවිධ දෘෂ්ටිකෝණ තුළින් අර්බුද ව්‍යාවර්තන ක්ෂේත්‍රයේ මෑතක දී ඇතිවී ඇති සංවර්ධන පිළිබඳ පැහැදිලි කිරීමක් ලබාදීම මෙහි අරමුණයි: ශාස්ත්‍රීය විශ්ලේෂකයන් සහ ඒවා භාවිත කරන්නන් මෙන්ම අර්බුද කලාපවල හෝ ඉන් පිටත සිට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් කටයුතු කරන විශේෂඥයින්ගේ දෘෂ්ටිකෝණ මෙයට ඇතුළත් වේ.



මෙම අත්පොත පිළියෙල වී ඇත්තේ අදියර කිහිපයකිනි. පළමුව, බර්ගොෆ් ආයතනයේ ඇති වෙබ් අඩවියක (www.berghof-handbook.net) පළවූ ලිපි සංග්‍රහයක් වශයෙන් මෙය නිකුත් කෙරිණි. මෙම වෙබ් අඩවිය පෙළගස්වා ඇත්තේ ඉලක්කගත ලිපිවල අඩංගු කරුණු පිළිබඳ විවාදයක් ඇති කිරීමේ අරමුණින්, ඒවා භාවිත කරන්නන්ගෙන් ලැබෙන ප්‍රතිචාර සඳහා වේදිකාවක් වශයෙනි. මෙම ප්‍රතිපෝෂණ, ප්‍රතිචාර, අතිරේක ලිපි සහ මෙම යෙදවුම් මගින්, අර්බුද ව්‍යාවර්තන ක්ෂේත්‍රය තුළ ඇති වී ඇති සංවර්ධනය පෙන්නුම් කරන අවස්ථාවේ දී අත්පොත් සහ වෙනත් ප්‍රකාශන එළිදැක්වීමට ඉඩකඩ සැලසිණි. දෙවනුව බොහෝ ශාස්ත්‍රඥයින් සහ ක්‍රියාකාරීන් මෙවැනි ලිපිවල සම්පූර්ණ එකතුවක් නිතර ඉල්ලා සිටි බැවින් මෙම මුද්‍රිත ප්‍රකාශනය නිකුත් කිරීමට අදහස් කෙරිණි.

අපේ වෑයමට, මෙම අත්පොතට ලිපි සපයන්නට අප ඇරයුම් කළ අපේ සගයින්ගෙන්-ලෝකය පුරා විසිරී සිටින ශාස්ත්‍රධරයින්ගෙන් ලද ඉතා යහපත් ප්‍රතිචාරයට අපි කෘතඥ වන්නෙමු. ඉතා පළපුරුදු ක්‍රියාකාරීන් සහ විදග්ධයින් වන ඔවුන්ගෙන් ඇතැමෙක් අර්බුද නිරාකරණයට අදාළ ක්ෂේත්‍රවල නියමුවෝ වෙති. මෙම අත්පොතේ පොදු ප්‍රමිතීන් සඳහා තමන්ගේ ශෛලිය වෙනස්කර ගැනීමේ භාරදූර වගකීම ඔවුහු භාරගත්හ. ඔවුන්ගේ දැනුම, කැපවීම සහ නම්‍යශීලීභාවය නොවන්නට මෙම අත්පොත් ව්‍යාපෘතිය සාර්ථක නොවන්නට තිබිණි. මෙම බර්ගොෆ් අත්පොතේ අන්තර්ජාල හා මුද්‍රිත ප්‍රකාශන සඳහා දායකත්වය ලබාදුන් සියලුම කර්තෘවරුන්ට අපේ ස්තුතිය පුද කරමු. අපේ පාඨකයන් සහ ඉහත දැක්වූ පිරිස සමග අප ක්ෂේත්‍රයේ න්‍යාය හා භාවිතය සම්බන්ධ සියුම් කතිකාවක් ස්ථාපිත කිරීම සඳහා අවස්ථාව නිරතුරුව ලැබේවා යැයි අපි නිතරම ප්‍රාර්ථනා කරමු.

© 2006 Berghof Research Center for Constructive Conflict Management

2003 වසරේ මැද භාගය දක්වා වෙබ් අඩවියේ ගැබ්ව තිබූ ලිපි ලේඛන එක්රැස් කිරීමෙන් ලබාගත් තොරතුරු මෙම ප්‍රකාශනයෙන් නියෝජනය වෙයි. මෙම මුද්‍රිත ප්‍රකාශනය මේ ව්‍යාපෘතියේ අවසාන ඵලය නොවන අතර බර්ගොෆ් අත්පොත් ව්‍යාපෘතිය තව දුරටත් ඉදිරියට ගෙන යෑමට බර්ගොෆ් කණ්ඩායම වෙර දරන නිසා මෙය 'අතුරු වාර්තාවක්' ලෙස සැලකිය යුතුය. ඉදිරි සංවර්ධන කටයුතුවලදී පහත සඳහන් කාරණා ද එයට ඇතුළත් වේ.

1. අතීතයේ ඉලක්ක කර ගැනුණු තේමා සහ ගැටලු යථාර්ථයක් කර ගැනීම.
2. විශේෂ උනන්දුවක් හා වැදගත්කමක් ඇතැයි සැලකෙන ක්ෂේත්‍රවල පවතින ගැටලු සම්බන්ධයෙන් විවාද සහ සාකච්ඡා පැවැත්වීම.
3. වෙබ් අඩවිය ප්‍රතිසංවිධාන ව්‍යාපෘතියේ කොටසක් ලෙස සේවා සැපයීම සහ ප්‍රතිපෝෂණ මාධ්‍යයක් ලෙස භාවිත කිරීම.

වාර්ගික දේශපාලනමය අර්බුද පිළිබඳ ක්ෂේත්‍රයෙහි සාම භාවිතාව හා විශ්ලේෂණය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන මිත්‍රයන් සහ සගයින්ට අපගේ වෙබ් අඩවියේ 'What's new' යන්න යටතේ පරීක්‍ෂා කර එහි ඇති නිර්මාණශීලී ලිපි ලේඛන පරිශීලනය මෙයින් අදහස් කෙරේ.

අනාගතයේ දී විවිධ වාද විවාද සහ සාකච්ඡා පැවැත්වීම මෙම 'ඉදිරි ව්‍යාපෘති' යටතේ සිදු කරනු ලැබේ. මෙම ප්‍රකාශනයේ පළමු කාණ්ඩයෙන් ආරම්භ කළ සාමය සහ අර්බුදවල බලපෑම් තක්සේරුවක් යන මැයෙන් පැවති විවාදයට ඒවා සමාන වනු ඇත. මෙම විවාදය දැනටමත් මුද්‍රිත ප්‍රකාශයක් ලෙස බර්ගොෆ් මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කර ඇත (ඇලෙක්ස් ඔස්ටින්, මාර්ටිනා ෆිෂර්, ඔලිවර් විලිස් (සංස්.)ඃ සාමය සහ අර්බුද බලපෑම් තක්සේරුව, න්‍යාය සහ භාවිතාව පිළිබඳ විචාරාත්මක මත, බර්ගොෆ් සාකච්ඡා අත්පොත් මාලාව, සංවර්ධනාත්මක අර්බුද කළමනාකරණයක් සඳහා වූ බර්ගොෆ් පර්යේෂණ මධ්‍යස්ථානය, බර්ලින් 2003 බලන්න). මේ නිසා මේ වෙළුමට ඇතුළත් කර ඇත්තේ මාක් හොෆ්මාන්ගේ පළමු දායකත්වය පමණි.

මෙම බර්ගොෆ් අත්පොත කරළියට ගෙන ඒමෙහිලා විවිධාකාර අයුරින් උදව් කළ ආයතන, සංවිධාන සහ මූල්‍යමය ආධාර ලබාදුන් සියලු හිතවතුන්ට ස්තුතිය පිරිනැමේ. විශේෂයෙන්ම අර්බුද පර්යේෂණය සඳහා වූ බර්ගොෆ් පදනම *(Berghof Stiftung für Konfliktforschung)* සහ ජර්මන් පෙඩරල් රජයේ අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය *(Bundesministerium für Bildung und Forschung)*. ඊට අයත් වේ.

බර්ගොෆ් අත්පොත සකස් කිරීමේ කණ්ඩායම සැකසුණු දා පටන් මේ ව්‍යාපෘතියට විවිධ අවස්ථාවල නන් අයුරින් උදව් කළ සියලු දෙනාට ම අපි ස්තුතිවන්ත වන්නෙමු. අපගේ සම කතෘ ඇලෙක්සැන්ඩර් ඔස්ටින්, ක්ලෝස්-ඩියටර් වයිල්ඩ්, රේනර් ස්ටෙයින්වෙග්, ඔලිවර් විල්ස්, ක්ලෙම් මැක්කාර්ට්නි, හිලරි ක්‍රෝව්, කොන්ස්ටාන්සෙ හෙල්ම්ෂෙන්, එරික් මැන්ටන්, ඇස්ට්‍රිඩ් ෆිෂර් සහ උල්රයික් හෙස යන අය මෙහිදී ප්‍රධාන වෙති.

**මාර්ටිනා ෆිෂර් සහ නෝර්බට් රෝපස්**

බර්ලින් /කොළඹ, ජූලි 20, 2003



© 2006 Berghof Research Center for Constructive Conflict Management

# හැඳින්වීම

මාර්ටිනා ෆිෂර්, නෝබට් රෝපස්

සීතල යුද්ධයේ අවසානයෙන් පසු ප්‍රචණ්ඩකාරී අර්බුදවල සංඛ්‍යාව සහ පරිමාණය සලකා බලන විට 21 වෙනි ශතවර්ෂය ආරම්භයේ දී මෙම අර්බුදවලට නව සාමකාමී විසඳුමක් සෙවීම සම්බන්ධයෙන් ඇති ඉඩකඩ පිළිබඳ සැක පහළ වේ. බහුපාර්ශ්වීයතාව විසින් පසුගිය දශක කීපය තුළ ලබාගත් ජයග්‍රහණ සුරැකීමේ ප්‍රයත්න ය හා එක්සත් ජනපදය විසින් මෙහෙයවනු ලබන ඒකපාර්ශවීයතාව අතර නව ලෝක සම්මුතියක් සඳහා වන අරගලකාරී සන්දර්භය තුළ අන්තර්-රාජ්‍ය ගැටුම් පවා යළි න්‍යාය පත්‍රයට ඇතුළත් වී ඇති බවත් පෙනී යයි.

දැනට පවතින සහ ඉදිරියට පැවතිය හැකි බොහෝ ප්‍රචණ්ඩකාරී අර්බුද, රාජ්‍ය තුළ පවතින අර්බුද සේ සැලකිය හැකි වුවත්, ඒවා සිවිල් යුද්ධ හෝ රාජ්‍ය නිර්මාණය සමග බැඳී පවතී. මෙයින් හැඟවෙන්නේ විවිධ කණ්ඩායම්, ආණ්ඩු බලය ලබා ගැනීමට අරගල කිරීමක් හෝ, එවැනි එක් කණ්ඩායමකට හෝ වෙනත් එකකට එරෙහිව, ආණ්ඩු විසින් කටයුතු කිරීමකි. මේවා ප්‍රධාන වශයෙන් ජනවාර්ගික දේශපාලනමය වශයෙන් නිර්වචනය වෙයි. අර්බුදයට මුල්වන ප්‍රධාන ම ගැටලු වන්නේ දේශපාලන බලය, සිවිල් අයිතීන්, සංස්කෘතික අනන්‍යතාව, ආර්ථිකමය ප්‍රතිලාභ හෝ ස්වාභාවික සම්පත් ලබා ගැනීම හෝ පවත්වා ගැනීමය. රාජ්‍ය දුර්වල වීමෙන් හෝ අභ්‍යන්තර පිපිරුමෙන් ඇතැම් යුද්ධ හටගන්නා අතර නව රාජ්‍ය බිහි කිරීම අරමුණු කරගෙන ද එවැනි අර්බුද ඇතිවේ. මෙවැනි අර්බුද බොහොමයක් සමස්ත සමාජයට ම හෝ කලාපීය ආර්ථිකයට බලපාන අතර ඒවා දිගුකල් පවතී.

අන්තර් රාජ්‍ය ගැටුම් මූලික වශයෙන් සලකා බැලෙනුයේත්, විවාද කෙරෙනුයේත් පවතින අන්තර්ජාතික පද්ධතියකට අයත් ආයතන තුළ වන අතර, නව භාවිතාවන් හා ආයතනික අනුහුරුවීම් ද, ගැටුම් සඳහා ප්‍රතිචාරක ක්ෂේත්‍රය සම්බන්ධ නව කතිකාවක් පමණක් නොව නව වාග්මාලාවක් ද සම්භවය ලද්දේ රාජ්‍යාභ්‍යන්තර ගැටුම් සම්බන්ධයෙනි. ගැටුම් ව්‍යාවර්තනය (Transformation) සඳහා වූ බර්ගොෆ් අත් පොතේ අදාළත්වය රඳා පවතින්නේ නියතයෙන් ම මේ දෙවනුව කී ක්ෂේත්‍රය සම්බන්ධයෙනි.

මෙම ක්ෂේත්‍රයේ කාර්යයන් සහ ප්‍රායෝගික හා සංකල්පමය ප්‍රතිචාර පිළිබඳ කතිකා වෙනම ම වූ වෘත්තීමය අනන්‍යතාවක් සහිත සුවිශේෂී ක්ෂේත්‍රයක් ලෙස ස්ථාපිත වන්නේ කෙසේද යන්න තවමත් විවෘත ප්‍රශ්නයකි. එහෙත් සංවර්ධන ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීම් මානුෂික ආධාරෝපකාර, මානව අයිතිවාසිකම්, රාජ්‍ය තන්ත්‍රය සහ සාම කටයුතු වැනි ක්ෂේත්‍රවල කටයුතු කරන විවිධාකාර ආයතන සහ සංවිධාන, වර්තමානයේ රාජ්‍යාභ්‍යන්තර අර්බුදවලට ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවල දැඩිව නියැලී සිටී. ඒවා මේ වන විට සිය කාලය, ශක්තිය, මානව සහ මූල්‍ය සම්පත් මෙම අදාළ ක්ෂේත්‍රවල ආයෝජනය කර ඇති අතර ඒවා ඇතැම්විට දැනටමත් ආයතනගත කර හෝ ඉදිරියේ දී ආයතනගත කිරීමට සූදානමින් සිටී.

© 2006 Berghof Research Center for Constructive Conflict Management

රාජ්‍යාභ්‍යන්තරයේ අර්බුදවලට ප්‍රතිචාර දක්වීමේදී අර්බුදයට හේතු පාදක වූ මූලික හේතූන් සලකා බැලිය යුතු අතර ඒ සඳහා අර්බුදයේ සම චින්තනයක් ඇති පාර්ශ්වකරුවන් අතර පොදු එකඟතාවක් ඇතිවිය යුතු යැයි මේ හා සම්බන්ධව කටයුතු කරන විද්වත්හු සහ ක්‍රියාකාරීහු පවසති. දෙවනුව, අර්බුදයට අදාළ සියලු කටයුතු සඳහා වඩා පුළුල් රාමුවක් පැවතිය යුතු බවත්, ඒ සඳහා අර්බුදයට සම්බන්ධ විවිධ දායාදයන් වන පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණය, සංවර්ධනය සහ රාජ්‍ය නිර්මාණය යන කොටස් ද ඒකාබද්ධ විය යුතු වේ. තෙවනුව, ඔවුන්ගේ මතය වන්නේ අර්බුදයට හේතු වූ මූලික හේතු සොයාගෙන, එමගින් අවුරුදු ගණනක් පුරා පැවතෙන ප්‍රචණ්ඩය සහ එදිරිවාදිකම් සඳහා විසඳුමක් සෙවීමේ අරමුණින් විවිධාකර අන්දමින්, බහුවිධ පරිමාණ සහිත ප්‍රවේශයන් යොදා ගන්නේ නම් එහිදී විවිධ මට්ටම්වල අන්තර් සම්බන්ධතා පැවතිය යුතු බවයි. එනම්, අන්තර්ජාතික, ජාතික, කලාපීය සහ දේශීය වශයෙනි. එය රාජ්‍යයේ ක්‍රියාකාරීන් පමණක් සහභාගී වන අංක 1 ගමන් පථයෙන් ඔබ්බට ගොස් බොහෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේද සහභාගීත්වයක් ඇති, පුළුල් 'බහු පථික' (multi-track) ප්‍රයත්නයන් කරා යා යුතුය.

මෙවැනි පුළුල් ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම පහසු කාර්යයක් නොවේ. එමෙන්ම, සෑම අර්බුදයක් ම එකිනෙකට වෙනස් ය. එක් අර්බුදයක් සඳහා භාවිත කෙරුණු ක්‍රමවේදය තවත් අර්බුදයකට සුදුසු නොවේ. රාජ්‍ය-අභ්‍යන්තර අර්බුදයනට කෙසේ ප්‍රතිචාර දක්වන්නේ ද යන්න පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීමට නම් අදහස් බෙදාහදා ගැනීම සහ දැනුම හුවමාරු කර ගැනීම අත්‍යවශ්‍ය බව අපි පිළිගන්නෙමු. ගැටුම් ව්‍යාවර්තනයේදී ප්‍රායෝගික ආනුභවික, සහ න්‍යායාත්මක දැනුම සමාලෝචනය කිරීමට කාලය එළඹී ඇතැයි අපි විශ්වාස කරමු. විවිධාකාර පාඨ ග්‍රන්ථ, ක්ෂේත්‍ර වැඩපොත් සහ ගැටුම් නිරාකරණය පිළිබඳ සුවිශේෂී අත්පොත්, තෙවැනි පාර්ශ්වයට මැදිහත් වීම සහ සාමය ගොඩනැගීම වැනි විෂයයන් පිළිබඳ පොත් විශාල සංඛ්‍යාවක් පසුගිය වසර ගණනාව තුළ ප්‍රකාශනයට පත් වී ඇත.



මෙම බර්ගොෆ් අත්පොතෙන් ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍රයේ පවතින ගැටලු පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මෙන්ම මෙම ක්ෂේත්‍රයේ මෑත කාලයේ විද්වතුන් හා භාවිතාවන් මගින් ලත් සංවර්ධන දෘෂ්ටිකෝණ පිළිබඳ තොරතුරු සැපයීම ද සිදුවේ. මෙම දෙක එක් කිරීම මගින් විස්තරාත්මක, බුද්ධිමත් හා ප්‍රතිඵලදායී භාවිතාව සඳහා දායකත්වයක් කළ හැකිය. මනාව ස්ථාපිත වූ විෂයයක් තුළ දැනුම ඒකාබද්ධ කර සමාලෝචනය කළ ප්‍රකාශනයක් ලෙස බර්ගොෆ් අත්පොත දැක්විය නොහැකිය. එය ස්ථාපිත භාවිතාවන් හා සංකල්පයන් මෙන්ම අතිදුෂ්කර ගැටලු හා අභියෝග පිළිබඳ යළි සලකා බැලීම හා අවධානය යොමු කිරීම සඳහා ප්‍රයත්නයකි. මෙම බර්ගොෆ් අත්පොත වට්ටෝරු එකතුවක් හෝ වහා භාවිත කළ හැකි මෙවලම් තොගයක් නොවේ. එය දැනට කෙරෙන ප්‍රායෝගික කටයුතු ඒවායේ කෘත්‍යාභාරය, ශක්තීන් හා දුර්වලතා අවබෝධය සඳහා පුළුල් සංකල්පමය රාමුවකට ඇතුළු කිරීම සඳහා වෙයි.

අත්පොතේ අරමුණ වන්නේ ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳව දැනට ඇති එළැඹුම්, ක්‍රමවේද, ශිල්පක්‍රම සහ න්‍යායයන් ගැන වෘත්තිකයන් හා විද්වතුන්ට යම් සාරාංශමය දැනුමක් ලබාදීමයි. මින් අදහස් කෙරෙනුයේ ක්ෂේත්‍රය පිළිබඳ 'නවීනමය තත්ත්වය' ලේඛනගත කොට ඇගයුම මෙන්ම මෙම

© 2006 Berghof Research Center for Constructive Conflict Management

එළැඹුම්වල ශක්‍යතා හා දුර්වලතා ගැන ආවර්ජනය කිරීමට අවස්ථා ලබාදීමයි. තවදුරටත්, ගැටුම් තුළ හා ඒ ගැන ක්‍රියාත්මක වන පුද්ගලයන් හා සංවිධාන මුහුණපාන උභතෝකෝටික ගැන ද ක්‍රියාත්මක වන පුද්ගලයන් හා සංවිධාන තුළ පවතින සංකීර්ණතා ඒකාබද්ධ කිරීම, සහ ඵලවත් වූත්, කාර්යක්ෂම වූත් ව්‍යාවර්තන උපාය මාර්ගවලට ඉඩ සැලසීම සඳහා වඩා සංගතික හා න්‍යායාත්මකව ප්‍රබල සංකල්ප සංවර්ධනයට උනන්දු කිරීම ද අපේක්ෂිතය.

ඒ අනුව මෙම අත්පොත,

- සංකල්ප, ක්‍රමවේද, උපාය මාර්ග සහ මෙවලම් සැකෙවින් දක්වීම මගින් අර්බුද ව්‍යාවර්තන ක්ෂේත්‍රය ක්‍රමවත්ව පැහැදිලි කරයි;
- සමස්තාර්ථය ලබාදීම සහ ක්ෂේත්‍රය තුළ දැනට පවතින න්‍යායාත්මක පරතරය පිටුදැකීම අරමුණු කර ගනිමින් න්‍යායයන් පිළිබඳව පවතින විචාර මතවාද සොයා බලයි;
- සාම සාධනය සහ සාමය ගොඩනැගුම පිළිබඳ ව්‍යුහාත්මක ප්‍රවේශ සමග ක්‍රියාදාම ප්‍රවේශ සමබර කිරීම සඳහා ඇති මාර්ග සොයා බලයි;
- අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන (IGO), ජාතික ආණ්ඩු, සංවර්ධන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ සිවිල් සමාජයේ අනෙකුත් පාර්ශ්වකරුවන් ඇතුළු සාමය ගොඩනැගීමේ ක්‍රියාවලට අදාළ විවිධ පාර්ශ්වකරුවන්ගේ භූමිකා විශ්ලේෂණය කරයි;
- මෙම පාර්ශ්වකරුවන් අතර ජාලකරණය සහ සම්බන්ධීකරණයට අදාළ ක්‍රමෝපා සාකච්ඡාවට භාජන කරයි;
- ගැටුම් ව්‍යාවර්තන ප්‍රයත්න සම්බන්ධයෙන් උගත් පාඩම්, හොඳම භාවිතාවන් සහ එම ප්‍රයත්න තක්සේරු කිරීමේ දුෂ්කරතා විමසා බලයි.

එබඳු විවිධ නව දැනුම් සම්භාරය එක්රැස් කිරීම, පහසු හෝ ඍජු කාර්යයක් නොවේ. මෙම ක්ෂේත්‍රයේ පවතින ප්‍රධානතම අභියෝග වන්නේ භාවිතය, පර්යේෂණය සහ න්‍යායය අතර පවතින දුර්වල සම්බන්ධතායි. ගැටුම් ව්‍යාවර්තනයේ විවිධාකාර ක්ෂේත්‍රවල දැනට පවතින දැනුම සංකල්පගත කිරීම හා ක්‍රමවත්ව තක්සේරු කිරීම ගැන මෙන්ම ගුරුහරුකම් ලබා ගැනීම, නිවැරදි සම්භාවිතාවන් සහ නිර්මාණශීලී චින්තනය පිළිබඳ වර්ධනීය උනන්දුවක් ද දක්නට ලැබේ. කෙසේ වෙතත්, සාර්ව සමාජ සහ දේශපාලන මට්ටමේ බලපෑම් සඳහා ඉවහල් වන විශේෂ ප්‍රායෝගික සූක්ෂම - අතරමැදි භාවයන් සන්දර්භගත කිරීම සඳහා වූ නිශ්චිත න්‍යායාත්මක ආකෘති සහ ආදර්ශ වර්ධනය කිරීම සඳහා දරා ඇති ප්‍රයත්න අල්පය. මෙම සාමාන්‍ය න්‍යායාත්මක පරතරයට අමතරව ගැටුම් ව්‍යාවර්තනයේ බොහෝ හුදෙකලා ක්ෂේත්‍රවල සුවිශේෂී ක්‍රමෝපායන් අපැහැදිලි වන අතර ඒවා 'වැඩි තරමට හොඳයි' යන සරල මතයට අනුකූල වූවාක් මෙනි. මේ නිසා අපගේ උනන්දුව වන්නේ භාවිතාව, ක්‍රමවත් පරිකල්පනය, පර්යේෂණය සහ න්‍යාය අතර ඇති ගැලතුම ශක්තිමත් කිරීම සඳහා දායකත්වය ලබා දීමයි.

මෙම ක්ෂේත්‍රය හා ක්ෂේත්‍රයට අදාළ විවිධාකාර ක්‍රියාකාරකම් හඳුන්වාදීම සඳහා වචන ගණනාවක් භාවිතා කෙරේ. ඒවා අතර, ගැටුම් කළමනාකරණය, ගැටුම් නිරාකරණය, ගැටුම් ව්‍යාවර්තනය, ගැටුම් නිවාරණය, සාමය ගොඩනැගුම ආදිය වෙයි. ගැටුම් ව්‍යාවර්තනය (transformation) යනු සමාජ සාධාරණත්වය සහ ස්ථාවර සාමය ඇති කිරීම සඳහාත්, අන්තර්- කාණ්ඩ ගැටුම් කෙරේ බලපෑමක් කළ



© 2006 Berghof Research Center for Constructive Conflict Management

හැකි ක්‍රියාකාරකම් සහිත සමස්තය පුළුල් සේ අවාරණය වන යෙදුමක් ලෙස අපි සලකමු. අර්බුද නිවාරණය, කණ්ඩායම් බලගැන්වුම සහ ප්‍රජා සංවර්ධනය කිරීම, ගැටුම් කළමනාකරණ සහ නිරාකරණ ක්‍රමෝපාය මෙන්ම පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණය සහ පශ්චාත් යුද්ධ අවස්ථාවන්හි දී සහජීවන ප්‍රයත්න වැනි ව්‍යුහාත්මක හා ක්‍රියාවලි සම්බන්ධ ප්‍රයත්න මෙම අවබෝධය සඳහා අදාළ වේ.

පසුගිය දශකය තුළ ගැටුම් නිවාරණය යන සංකල්පය, විශේෂයෙන් සාම පර්යේෂණය සහ අන්තර්ජාතික සම්බන්ධතා මෙන්ම අන්තර්ජාතික සංවිධාන පිළිබඳ කතිකාවන්හි ඉතා ආකර්ශණීය එකක් විය. ප්‍රචණ්ඩ ගැටුම් නිරාකරණය පිළිබඳ ප්‍රවේශ සහ මෙවලම් පිළිබඳ සාකච්ඡා බොහෝ පොත් සහ ශාස්ත්‍රීය ලිපිවල සාකච්ඡා වී ඇත. ප්‍රචණ්ඩකාරී අර්බුදයක ආදර්ශමය ගතිකත්වය පදනම් කරගෙන එම ගැටුම නිරාකරණය පිළිබඳ ගතික සංකල්ප තුනක් අදියර වශයෙන් මතු වූ අතර ඒ සඳහා වෙනස් වූ ප්‍රයත්න සහ ප්‍රවේශ හා අවශ්‍ය වෙයි.

1. ප්‍රචණ්ඩ ගැටුමක පරිනාමික අවස්ථා නිවාරණය සඳහා (පෙරකල්) නිවාරණය;
2. පවතින ප්‍රචණ්ඩ ගැටුම තිරස් හා සිරස් වශයෙන් ප්‍රචලිත වීම නිවාරණය සඳහා "අවසන් මොහොතේ" නිවාරණය;
3. සාම ගිවිසුම් සහ සටන් විරාමවලට පසු යළි භීෂණය ඇතිවීම නිවාරණය (වැළැක්වීම) සඳහා පසු ගැටුම් ක්‍රියාකාරකම්

ගැටුම් ව්‍යාවර්තන සංකල්පයට එවන් අවධානයක් ලැබී නැත. කෙසේ වෙතත් ගැටුම් නිවාරණය සඳහා වන ප්‍රයත්නවල ගැටුම් ව්‍යාවර්තනය ද පූර්ව කොන්දේසියක් ලෙස අන්තර්ගත වියයුතු යැයි අපි විශ්වාස කරමුඃ එනම්, ගැටුමට මැදිහත් වී සිටින පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට එම ගැටුමේ හේතු හා ඵලදායී ලෙස කටයුතු කිරීමට හැකියාව ලබා දිය යුතු අතර ඒවා ඉවත් කිරීමට හෝ මැඩලීමට අවශ්‍ය ක්‍රමෝපායයන් සැකසිය යුතුය. අපේ අවබෝධය අනුව, ගැටුම් ව්‍යාවර්තනය යනු ගැටුමක ඇති විවිධාකාර ගතිලක්ෂණ සහ එහි එළිදැක්වීම් වෙනස් කිරීමට ගනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධ පුළුල් සංකල්පයක් වේ. එහිදී එක්තරා සුවිශේෂී ගැටුමක් සඳහා මුල් වූ හේතු කරණාවලට දීර්ඝකාලීන විසඳුම් සැපයීමත් මෙයට අදාළ වේ. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ගැටුමක් සම්බන්ධයෙන් ඍණාත්මකව කටයුතු කිරීමෙන් බැහැරව ධනාත්මක ඵලදායී ආකාරයෙන් කටයුතු කිරීමයි. අර්බුදයක ව්‍යුහාත්මක, චර්යාමය සහ ආකල්පමය ව්‍යාවර්තනයක් මෙම ගැටුම් ව්‍යාවර්තන සංකල්පයෙන් අවධාරණය කෙරේ. එය සාධාරණ සාමයක් සඳහා වූ ක්‍රියාවලිය සහ ව්‍යුහය යන අංශ දෙක ම සලකා බලයි.

ගැටුම් ව්‍යාවර්තන සංකල්පය සවිස්තරව දක්වා ඇත්තේ රාජ්‍යාන්තර ගැටුමක එක් විශේෂ මූලාකෘතියක් වෙනුවෙනිඃ එනම් 'කල් පවතින සමාජ ගැටුම' සඳහා යි. මෙම යෙදුම මුලින් ම සාදන ලද්දේ 1970 දශකයේ අග භාගයේ දී එඩ්වඩ් අසර් විසිනි. පොදු ලක්ෂණ පෙන්නුම් කරන, ඉතා දිගු කාලයක් තිස්සේ පවතින වර්ගවාදී දේශපාලන ගැටුම් විස්තර කිරීම සඳහා මෙම යෙදුම බහුල වශයෙන් දැන් භාවිත කෙරේ. ඔහු පවසන පරිදි මේවාහි පහත සඳහන් ප්‍රධාන ලක්ෂණ සතර අඩංගු වේ.

- මේවා අනන්‍ය කණ්ඩායම් අතුරෙන් අඩු වශයෙන් එක් කණ්ඩායමක් සමානාත්මතාව, ආරක්ෂාව සහ දේශපාලන නියෝජනය පිළිබඳ සිය මූලික අයිතීන්වලට නිසි ගරු කිරීමක් ලැබී නැතැයි සැලකීමෙන් ඇතිවන ගැටුම්ය;



© 2006 Berghof Research Center for Constructive Conflict Management

- මේවා අවශ්‍යයෙන් ම රාජ්‍ය බලයට ඇති ඉඩකඩ හා සම්බන්ධ වන අතර, බොහෝ විට ආණ්ඩුව හා කැරලිකාර කණ්ඩායමක් අතර ඇතිවන අසමමිතික ගැටුම්ය;
- මේවා සිද්ධ දාමයේ විවිධ අවස්ථාවන්ට බලපාන විවිධ ආකාරයේ අන්තර් ජාතික සම්බන්ධතා හඳුනා ගැනීමකින් තොරව වටහා ගැනීම අපහසුය (බන්ධු රාජ්‍ය; දෙශත්‍යාගීන් අන්තර්ජාතික මැදිහත්වීම්);
- මේවා බොහෝ විට එකිනෙකාට එරෙහි කණ්ඩායම් ඉතිහාසගත එදිරිවාදිකම් මත පදනම් වේ;

කාලාන්තරව පවතින සමාජ ගැටුම් ව්‍යාවර්තනය අවධාරණය කිරීම යනු මෙම සිවි වැදෑරුම් අවබෝධය ගැන සැලකිල්ල දක්වීමයි; බහු වාර්ගික දේශපාලන ක්‍රමයක ජනවාර්ගික සුජාත බව පිළිගත යුතුයි. වාර්ගික ඉල්ලීම්වල නීතිගතභාවය පිළිගත යුතුවෙයි. මෙහිදී බලය භුක්ති විඳීම රාජ්‍ය ප්‍රතිසංස්කරණයක් පිළිබඳ පුළුල් සංකල්ප අත්‍යවශ්‍ය වේ. මෙහිදී අන්තර්ජාතික පාර්ශ්වකරුවන්ගේ සහ අන්තර්ජාතික ප්‍රජාවේ කාර්යභාරය මනාව තක්සේරු කළ යුතු අතර ප්‍රචණ්ඩත්වය සහ අමිහිරි අතීතයේ යම් ප්‍රමාණයක ඒකාබද්ධවීමක් ද අත්‍යවශ්‍යය. ගැටුම් ව්‍යාවර්තනයක අත්‍යවශ්‍යතාව පදනම් වන්නේ මෙම දරුණු ගැටුම මිනිස් ජීවිත විනාශ කිරීම, ජීවිකාවන් විනාශ කිරීම සහ යටිතල පහසුකම් විනාශයට පත් කිරීම පමණක් නොව සමස්ත සමාජ ප්‍රාග්ධනය ම විනාශයට පත්කරවන බැවිනි. එම නිසා මෙම ව්‍යාවර්තනය සහන, ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම සහ ප්‍රතිසංස්කරණය මෙන්ම මානසිකභාවයන් නැවත ලබාගැනීම සහ සමථයක් සඳහා කටයුතු කිරීම යන කරුණුවලිනි.



මෙම පුළුල් අවබෝධය නිසා ගැටුම් ව්‍යාවර්තනය මෙම බර්ගොෆ් අත්පොතේ ප්‍රමුඛ සංකල්පය ලෙස අපි තෝරා ගත්තෙමු.

ගැටුම් ව්‍යාවර්තනයේ විවිධාකාර පරිමාණයන්ට අනුකූලව මෙම මාතෘකා ව්‍යුහය සංවිධානය කර ඇත. ගැටුම් කළමණාකරණය සහ ගැටුම් නිරාකරණය වැනි ගැටුම් ව්‍යාවර්තනයේ මූලික සංකල්ප වෙනුවෙන් මෙහි ප්‍රථම භාගය වෙන් කර ඇත. ඊට අමතරව ගැටුමකට මැදිහත්වීමේ හරස් කැපුම් අභියෝග පිළිබඳ අවධානය යොමු කරවන අතර, ගැටුම් කෙරේ මැදිහත්වීමට අදාළ මූලික පරිමාණ සම්බන්ධව සම්පිණ්ඩනයක් මෙම කොටසින් දක්වෙයි.

ගැටුම් ශිෂ්ටාචාරකරණය පිළිබඳ න්‍යායාත්මක ප්‍රශ්න සාකච්ඡා කරමින් ඩියටර් සෙන්ගාස් මෙම කොටස ආරම්භ කරයි. 'හේතු මූලක' හෝ 'අර්ථාන්විත' සංහිඳියාව ගැටුම් ව්‍යාවර්තනයේ මෙහෙයුම් මතය බව ඔහු සලකයි. සිවිල් හෝ අන්තර්ජාතික යුද්ධ අරාජිකභාවයේ ප්‍රතිඵලයක් නම් එය ඉවත් කළ හැක්කේ සමාජ ක්‍රමයක් මගින් පමණි. මෙය ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමෙන් ගොඩනැගිය යුතුවෙයි. මෙහි දී ලේඛකයා සංකීර්ණ සාම ආදර්ශයක් ගොඩනගයි. ශිෂ්ටත්වයේ ෂඩස්‍රය, එහි සංරචක 06 ක් අඩංගුය (1. රාජ්‍යය සතු බල ඒකාධිකාරය, 2. නීතියේ ආධිපත්‍යය, 3. ප්‍රජාතාන්ත්‍රික සහභාගීත්වය, 4. අර්ථාන්විත ගැටුම් කළමනාකරණය, 5. සමාජ සාධාරණත්වය සහ සමානාත්මතාව, 6. අන්තර් පරායත්තතාව සහ බලපෑම් පාලනය); ප්‍රචණ්ඩතාවට නැඹුරු දේශපාලනමය, සමාජ ආර්ථිකමය සහ සමාජ සංස්කෘතිකමය වටපිටාවක ගැටුම් ශිෂ්ටත්වය කරා යොමු කිරීමේ පදනම වන්නේ මේ කාරණාය. ලේඛකයා තර්ක කරන්නේ අර්ථාන්විත සංහිඳියාව 'සාමය ගැන සිතීම'

© 2006 Berghof Research Center for Constructive Conflict Management

සහ 'සාමය ගොඩනැගීම' සඳහා අවශ්‍ය කරන රාමුව සකස් කරන අතර, ඒ දැනට ගන්නා ප්‍රයත්න සඳහා ආභාසය ලැබිය හැකි මූලාශ්‍රයක් බවයි. මෙහිලා මෙහෙයුම් මූලධර්මයක් ලෙස ගත හැක්කේ සාමයේ මිණුම් දණ්ඩ නම් සාමය ම පමණකි යන්නයි. මෙම චින්තන දායාදය 20 වන සියවසේ මුල භාගයේ දී ඉදිරිපත් වූ අතර, දැන් එය යළි පණගැන්විය යුතුය.

ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ ඇති ක්‍රමෝපායන් පිළිබඳ තාවකාලික නිර්වචනයක් සහ සාමාන්‍ය සම්පිණ්ඩනයක් *කෝර්ඩියුලා රේමාන්* ඉදිරිපත් කරයි. ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩපිළිවෙල පිළිබඳ විමර්ශනයක් සහ පර්යේෂණ ප්‍රශ්න පිළිබඳව ද, න්‍යාය සහ පර්යේෂණ ක්‍රමවල කාර්යභාරය පිළිබඳ විශ්ලේෂණයක් ද මෙයට ඇතුළත් ය. මෙහිදී ලේඛිකාව විශේෂ වූ ප්‍රවේශ තුනක් ඉදිරිපත් කරයි: ගැටුම් සමථය, ගැටුම් නිරාකරණය සහ ගැටුම් ව්‍යාවර්තනය යනු ඒවා යි. මෙහිදී ඉදිරිපත් වන එක් ප්‍රධානත ම නිගමනයක් වන්නේ ගැටුම් නිරාකරණය සහ ගැටුම් සමථය යන සංකල්ප චිරස්ථායිව පවත්නා, මැඩලිය නොහැකි අන්තර් රාජ්‍ය මට්ටමේ ගැටුම්වල සංකීර්ණත්වය සඳහා පිළිතුරු නො සපයන බවයි. මේ නිසා විවිධාකාර න්‍යායාත්මක රාමු එහි පාර්ශ්වකරුවන් ද අදාළ ක්‍රමෝපායන් ද සමග සංස්ලේෂණය හා ඒකාබද්ධ කිරීම අත්‍යවශ්‍ය වේ. සමස්ත ක්ෂේත්‍රය තුළ න්‍යායය හා පර්යේෂණ ක්‍රමවේදයන්හි කාර්යභාරය පිළිබඳ ලේඛිකාවගේ සාකච්ඡාව න්‍යායාත්මක සම්පූරකතාව, ඥාන විභාගමය නියමයන් අනුව (එය විශ්ලේෂණය කරන ආකාරය අධ්‍යයනයයි) පවත්වා ගත යුත්තේ කෙතරම් දුරට, කවර හෙයින්දැයි පැහැදිලි කරයි.



ගැටුම් ව්‍යාවර්තනයේ සම්භාවිතා විධි සහ න්‍යායවාදීන් පිළිබඳ මූලික කරුණු හඳුනාගන්නා හ්‍යු මියල් ඒවා ගැටුම් නිරාකරණයේ සහ ගැටුම් ව්‍යාවර්තනයේ න්‍යායයන් සහ සම්භාවිතාව අතර වෙනස වටහා ගැනීමට උත්සාහ කරයි: ඒ අතරම ඔහු පැරණි සම්ප්‍රදායෙහි ආභාසය ගැටුම් ව්‍යාවර්තනයේ දී බෙහෙවින් භාවිතා වන බවට තර්ක කරයි. එමෙන් ම ගැටුම්වල වත්මන් ස්වභාවය වේගවත්ව වෙනස්වීම්වලට භාජනය වන බැවින් මෙම ක්ෂේත්‍රය පිළිබඳව ඇති න්‍යායයන් හා භාවිතාවන් නොනැවතී වර්ධනය වන බව ඔහු නිගමනය කරයි. දේශීය සන්නද්ධ ගැටුම්වලට බෙහෙවින් බලපාන ගෝලීය හේතු සහ ප්‍රතිවිපාක ඇති අතර, අර්බුදවල දී මැදිහත්වීම සහ අර්බුද යන කාරණා දෙක ම ගෝලීයකරණය වී ඇත. අර්බුද විශ්ලේෂණය යන විෂය පථය අර්බුදයේ සිට අර්බුද සන්දර්භය දක්වාත් අර්බුදයට ලක්වී ඇති සමාජයේ සිට ගෝලීය සහ ප්‍රාදේශීය පරිසරය දක්වාත් විස්ථාපනය විය යුතු යැයි ඔහු තර්ක කරයි. මෙයින් බටහිර දෘෂ්ටිකෝණ ආධිපත්‍යය දරණ න්‍යායන් සහ භාවිතාවල දී සංස්කෘතිකමය අභියෝගයන් නිර්මාණය වනු පමණක් නොව වෛරය සහ බලහත්කාරම අසීමිතව අනුමත කෙරෙන සන්දර්භවල සාමකාමී ක්‍රියාමාර්ග පෙරදැරි කර ගන්නා ක්‍රියාකාරීන් වෙත සදාචාරාත්මක ප්‍රශ්න ද පැන නැගෙනු ඇත.

ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශ අත්‍යාවශ්‍යයෙන් ම බල අසමමිතිකතා, සමාජභාවමය අසමතුලිතතා සහ සංස්කෘතිකමය වෙනස්කම් යන කරුණු ගැන තැකිය යුතු බව ඩයනා ෆ්‍රැන්සිස් අවධාරණය කරයි. මෙම කාරණා දැඩිව එකිනෙක හා බැඳී පවතින අතර විශේෂයෙන් ම අර්බුදයට මැදිහත්වන බාහිර පාර්ශ්වකරුවන් විසින් මේවා විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු වේ. සමස්තයක් වශයෙන් පවතින ගෝලීය සංස්කෘතික ඒකාධිකාරය යටතේ ඇතිවන පීඩනය සහ සූරාකෑම්, විශේෂයෙන් ම පිරිමින් විසින් කාන්තාවන්ට එරෙහිව සහ දකුණු අර්ධ ගෝලයට එරෙහිව බටහිර රාජ්‍යයන් වශයෙන් සිදුවන

© 2006 Berghof Research Center for Constructive Conflict Management

බවට රචකයා තර්ක කරයි. අධිරාජ්‍යවාදය නිසා ජනිත වූ බල අසමතුලිතතා සංස්කෘතිකමය වෙනස්කම් තුළට පුපුරා යන ලක්ෂණ රුවා ඇති නිසා එවැනි අර්බුද හා කටයුතු කිරීම ඉතාමත් අසීරු වී ඇත. සමාජභාවය, සංස්කෘතිකමය ගොඩනැගීමක් වන අතර කාන්තාවන්ට එරෙහිව සිදුවන පීඩා සහ අසාධාරණකම් සංස්කෘතික කෝණයකින් බලා සාධාරණීකරණය කරන අතර, කාන්තා විමුක්තිය යනු බටහිර ව්‍යාපෘතියක් ලෙස සැලකේ. එසේ වෙතත් සමාජභාවය පිළිබඳ සබඳතා සහ ගොඩනැගීම් සම්බන්ධයෙන් ඇති පීඩන පිළිබඳ ප්‍රශ්න සලකා බැලිය යුතු අතර ගැටුමට දායක වන සමාජභාවය පිළිබඳ කාර්යභාර හා කල්පිතයන් විශ්ලේෂණයට භාජනය කළ යුතු වේ. කතුවරයා තර්ක කරන පරිදි සාමාන්‍යයෙන් කාන්තා හා පයර්‍යන්ත කණ්ඩායම්වල විමුක්තිය සම්භවය ලබන්නේත්, එයට උත්තේජනය ලබාදෙන්නේත්, ගැටුම් ව්‍යාවර්තනයෙන් ගම්‍ය වන මූලික සංස්කෘතික විතැන්වීම පමණි. මෙම අරමුණු සහිතව ගැටුමකට මැදිහත්වන පාර්ශ්වකරුවන් සිය සාරධර්ම සහ අරමුණු පිළිබඳ ව පාරදෘශ්‍ය භාවයකින් කටයුතු කළ යුතු අතර එය සිය සංවිධානය තුළ ක්‍රියාත්මක කිරීමේදී ද එය සුරැකිය යුතු වේ.

ද්විතීය භාගයෙන් සාකච්ඡා කෙරෙන්නේ ගැටුම් පිළිබඳ අනාවැකි පළ කිරීමේ දී සහ විශ්ලේෂණයට භාජන කිරීමේ දී භාවිත වන මෙවලම් පිළිබඳවයි. එමගින් ගැටුම සඳහා මැදිහත්වීමේ බලපෑම තක්සේරු කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනට පවතින විවාදය ද එමගින් හුවා දැක්වෙයි.

20 සියවසේ අගභාගයේ සහ 21 වන සියවසේ මුල භාගයේ පැවති සන්නද්ධ ගැටුම්වලට බලපෑ හේතුන් පිළිබඳ වත්මන් සොයා ගැනීම් පිළිබඳ සමාලෝචනයක් *ඩෑන් ස්මිත්* ලබාදෙයි. ගැටුම් විශ්ලේෂණය කිරීමේ දී ඒවා තීව්‍ර විය හැකි ක්ෂේත්‍ර පිළිබඳ අනතුරු ඇඟවීම් මෙමගින් ඉස්මතු කර දක්වනු ලබන අතර අර්බුදය තීව්‍රවීම වැළැක්වීම සඳහා ඇති අවස්ථා සොයා ගැනීම පිළිබඳ අවබෝධයක් ද එමගින් ලබාදෙයි. ක්‍රමවේදය පිළිබඳව සැකිල්ලක් සාදන්නට පෙර මෙම ක්ෂේත්‍රය පිළිබඳ න්‍යායාත්මක දැනුමෙහි පවත්නා තත්ත්වය කතුවරයා සාකච්ඡා කරන්නේ සන්නද්ධ ගැටුම් අධ්‍යයනය හා විශ්ලේෂණය සඳහා න්‍යායාත්මක ප්‍රවේශයේ සිට ව්‍යවහාරික ප්‍රවේශය වෙත නැඹුරු වෙමිනි. පසුබිම් සහ ඉදිරියේ ඇති හේතු අතර අන්තර් ක්‍රියාකාරීත්වය පිළිබඳව මෙහි දී වැඩි අවධානයක් යොමු කෙරේ. සන්නද්ධ ගැටුම්වලට හේතු නිර්වචනය කිරීමේ දී අසාධාරණත්වය සහ (බල) පිරිස් ප්‍රධාන සංකල්ප වූ බැව් පෙනී යයි. මෙය වඩාත් පැහැදිලි කිරීම සඳහා කතුවරයා උදාහරණයක් ලබා දේ: පැරණි යුගෝස්ලෝවියාව පරිහානියට පත්වෙමින් පැවැති වකවානුවේ ගැටුම හේතුවෙන් දේශපාලන ඒකරාශී වීම සඳහා අරමුණු වශයෙන් සලකා ගත් (සමාජ) අසාධාරණය හා අනන්‍යතාව පිළිබඳ සංකල්ප වැදගත් වේ.

පූර්ව අනතුරු ඇඟවීමේ කාර්යයන් පිළිබඳව හැඳින්වීමක් ඇලෙක්ස් ඔස්ටින් ලබාදෙයි. පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් මගින් පහත සඳහන් අරමුණු ඉටුකළ හැකි වේදැයි කතුවරයා විවේචනාත්මකව සාකච්ඡා කරයි: (අ) ගැටුමට හේතු වූ හේතු හඳුනා ගැනීම, (ආ) ගැටුම ඇතිවීම කල්තියා දැන ගැනීම, (ඇ) ගැටුම් සමනය/ පූර්ව දැනුම්දීම් පද්ධතිය තුළ ගැටුම සමනය සඳහා යාන්ත්‍රණයක් නැත්නම් පවත්නා ආදර්ශවල නිවරද්‍යභාවය වැඩි කිරීමට යත්න දැරීමෙන් එතරම් වැඩක් නැති බවට ඔහු තර්ක කරයි. පූර්ව දැනුම් දීම් ක්ෂේත්‍රයේ නව්‍ය ප්‍රවණතා මෙම ලිපිය මගින් හකුළුවා දැක්වෙන අතර එමගින් විවිධ ඉලක්ක ක්ෂේත්‍ර, ක්‍රමවේද සහ භාවිත කෙරෙන යාන්ත්‍රණ හඳුන්වා දෙයි. මෙම



© 2006 Berghof Research Center for Constructive Conflict Management

යාන්ත්‍රණය පූර්ව දැනුම්දීම සඳහා එක් ආදර්ශයක් ලෙස සංක්ෂිප්ත කොට දක්වා පූර්ව දැනුම්දීමේ සිට පූර්ව ප්‍රතිචාරය දක්වා සංක්‍රමයේ දී මුහුණපාන්නට වන ප්‍රධාන අභියෝග දැක්වීමෙන් ලිපිය අවසන් වේ.

මැදිහත්වීමේ උපාය මාර්ග තක්සේරුව සහ සැලසුම් සඳහා වන සංකල්ප සහ අත්දැකීම් ටානියා පැෆෙන්හෝල්ස් හකුළුවා දක්වයි. ගැටුමේ නිශ්චිත අවස්ථාවක, කුමන මොහොතක සහ කුමන උපාය මාර්ග සහ මෙවලම් සහිතව කවර පාර්ශ්වකරුවාගේ මැදිහත්වීමක් සිදුකළ යුතු වේ ද යන ප්‍රශ්නය ඇසුරෙන් ඇතිවන ගැටලු පිළිබඳව මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ. සිය ක්ෂේත්‍ර අත්දැකීම් උපයෝගී කර ගනිමින් මෙම ලේඛිකාව මැදිහත්වීම් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කාරණා 10 ක් මෙහි දී සඳහන් කරයි: 1. දර්ශනය, අරමුණ සහ කැපවීමක අවශ්‍යතාව, 2. ගැටුම් සහ එහි ක්‍රියාකාරීන්ගේ විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදය, 3. මැදිහත්වන ක්‍රියාකාරීන්ගේ කාර්යභාර සහ උපාය මාර්ග, 4. අවශ්‍ය තරම් පාර්ශ්වකරුවන් සහ ප්‍රවේශ ස්ථාන සඳහා පවතින නිරන්තර සෝදිසිය, 5. මැදිහත්වීමේ සහ ඉවත්වීමේ කාල නිර්ණ විකල්ප, 6. ක්‍රියාවලීන් ගැන චින්තනය හා ව්‍යුහ ගොඩනැගීම 7. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ නිර්ණායක, 8. සම්බන්ධීකරණය සහ සහයෝගිත්වය, 9. ස්ථාවර අරමුණු ඇතුළත් කිරීම සහ 10. මැදිහත්වීම් ක්‍රියාවලි තුළට අධ්‍යාපනය අඩංගු කිරීම. ගැටුම් ව්‍යාවර්තනයේ ලා රාජ්‍ය නොවන සංවිධානගත යථාර්ථය පිළිබඳ දෘෂ්ටිකෝණය තුළින් මෙම කාරණා පර්යේෂණයට භාජනය කොට අවසාන වශයෙන්, ලේඛිකාව සංවිධාන සහ වැඩසටහන් තුළ දැනුම් කළමනාකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු ඉස්මතු කරදෙයි.



මාක් හොෆ්මාන් සාමය සහ ගැටුම් බලපෑම් තක්සේරු කිරීමේ (PCIA) නව්‍යතම ක්‍රමවේදයක් පිළිබඳව දෘෂ්ටිකෝණ තුනකින් අවධානය යොමු කරයි: සාම්ප්‍රදායික දායක තක්සේරුව, සංවර්ධන කටයුතු තක්සේරු කිරීමේ ක්‍රමවේද සහ ගැටුම් නිරාකරණය හා සාමය ගොඩනැගීමේ නිරත රාජ්‍ය නොවන සංවිධාන (NGO) පිළිබඳ තක්සේරුවක් ද වෙයි. සාමය හා ගැටුම් බලපෑම් තක්සේරුව පිළිබඳ ප්‍රායෝගික ඇඟවීම් හඳුනා ගැනීමෙන් පසු අවසානයේ විවෘත ප්‍රශ්න, ගැටලු සහ ඉදිරි කටයුතු ගැන සාකච්ඡා කෙරෙයි. මේවා පවත්නේ සාමාන්‍ය හා සුවිශේෂී දර්ශක භාවිතය, විවිධ තක්සේරු ක්‍රම අතර අන්තර් සම්බන්ධතා සන්දර්භගත කිරීම සහ අවසාන වශයෙන් විවිධ අංශවල ඇති අන්තර් සම්බන්ධතාව ඇසුරු කොට ගෙනය.

මානුෂික සහනාධාර සැපයීමේ වැඩසටහන්, සංවර්ධන ආධාර සහ/හෝ සාමයට ලබාදෙන ආධාර අන්තර්ජාතික ආයතන ඒවායේ බලපෑම තීරණය කරනුයේ කෙසේදැයි යන්න *මේරි බී ඇන්ඩර්සන්* විමසුමට ලක් කරයි. තමන් කටයුතු කරන සමාජයේ ඇති ගැටුම් සඳහා බාහිර ඒජන්සි විසින් කෙරෙන බලපෑම් පිළිබඳව වැඩිදුර අවබෝධය සඳහා ගන්නා සාමූහික ප්‍රයත්න ගැන මෙම පරිච්ඡේදයෙන් විස්තර සැපයෙයි. සාම ව්‍යාපෘතියේ දේශීය ශක්‍යතා (LCCP) පිළිබඳව මෙම පරිච්ඡේදයේ එක් කොටසක් වෙන්කර ඇති අතර අනෙක් කොටස මගින් දැනුම ව්‍යාපෘති දේශීය ශක්‍යතා සාම අභ්‍යන්තර ව්‍යාපෘති ආවර්ජනය (RPP) ගැන අලුත්ම සොයා ගැනීම් පිළිබඳව විස්තර කෙරේ. මෙම සොයාගැනීම් සම්බන්ධීකරණය කර ඇත්තේ ඇයගේ සංවිධානය වන සංවර්ධන කාර්යයසාධක එකමුතුව (CDA) සහ ස්වීඩන ජීවිත හා සාම ආයතනය මගිනි. මෙම ලේඛිකාවට අනුව, ගැටුම් අවම කිරීම සඳහා කළ හැකි මැදිහත්වීම් සොයා ගැනීම හා තක්සේරු කිරීමේ දී ප්‍රධාන අභියෝග දෙකකට මුහුණ දීමට

© 2006 Berghof Research Center for Constructive Conflict Management

සිදුවේ: පළමුවැන්න නම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා වන තීර්ණායක සහ දර්ශකයන් හඳුනා ගැනීමයි (ගැටුම් ව්‍යාවර්තනය සම්බන්ධයෙන් සුදුසු වන සහ යෝග්‍ය මිණුම් දණ්ඩක් පිළිබඳ ප්‍රශ්නය මේ හා සම්බන්ධයි). දෙවැන්න නම්, ආරූඪ ලක්ෂණ නිර්ණය කිරීමයි. ඉතා සංකීර්ණ පරිසරයක් තුළ විවිධාකාර දේ සිදුවන විට කිනම් ක්‍රියාවකින් කුමන අන්දමේ ප්‍රතිඵලයක් ලැබේදැයි කාටනම් කිව හැකි ද? මෙහි දී මෙම ලේඛිකාව අවසන් කරන්නේ ඉතා පැහැදිලි පණිවුඩයක් සමගයි: සිය වැඩසටහන්වල දී ආධාර දෙන කාර්යයේ නියුක්තයන් සහ සාම ක්‍රියාකාරීන් විසින් කිසිදු 'හානියක් නොසිදු කිරීම' ප්‍රමාණවත් නොවේ. බලපෑම් තක්සේරුව සිය කටයුතුවල අවයවීය කොටසක් ලෙස සලකා ඔවුන් මෙම කටයුතු දියත් කළ යුතුය. අවුරුදු ගණනක් තිස්සේ සිය කාර්යය නියුක්තියෙන් ලබාගත් දැනුම භාවිත කරමින් ඔවුන්ට සිය ක්‍රියාශීලීත්වය වර්ධනය කරගත හැකි වන අතර සිය වෙනස්කම් ගැටුමින් තොරව නිරාකරණය කර ගත හැකි සාධාරණ සමාජ බිහිකරලීම සඳහා දායක විය හැකියි.

අන්තර් කණ්ඩායම් සහ අන්තර් පුද්ගල මට්ටමෙන් ගැටුම් සඳහා මැදිහත්වීමේ සහ ඒවා සමග කටයුතු කිරීමේ ශක්‍යතාවන් වර්ධනය කිරීමේ කාර්යයන් පිළිබඳව මෙම අත්පොතේ තෙවැනි භාගය වෙන් කර ඇත. ගැටුම් ව්‍යාවර්තනයේ මනෝසමාජ පරිමාණ පිළිබඳවත් පුද්ගල හා සාමූහික දැනුම් ක්‍රියාවලීන් පිළිබඳවත් මේ කොටස කැප වේ.

අන්තර් - කාණ්ඩ ගැටුම් ව්‍යාවර්තනයේ දී අන්තර්-පුද්ගල සහ පෞද්ගලික මට්ටමෙන් පහසුකම් සපයන්නන්ගේ ශක්‍යතා වර්ධනය සඳහා අවශ්‍ය කරන හැකියා සහ මෙවලම් වර්ධනය කිරීමේ අවශ්‍යතාවය *රෝන් ක්‍රෙබ්ල්* විස්තර කරයි. සන්නිවේදන හැකියා සහ මෙවලම් ව්‍යාවර්තනීය වන්නේ කිනම් අයුරින්දැයි ලේඛකයා විස්තර කරයි. පහසුකම් සපයන මෙවලම් වර්ග තුනක් මෙහි දී සමාලෝචනය කෙරේ: ඒවා නම් පාර්ශ්ව අතර මොහොතින් මොහොත සිදුවන අන්තර් සම්බන්ධතා සඳහා භාවිත වන හැකියාවන්; තිරසර සංවාදය සඳහා පහසුකම් සැපයීමේ තාක්ෂණය සහ ගැටුමක ප්‍රධාන ව්‍යුහාත්මක සහ ආයතනික යථාර්ථයන් පුළුල් අන්දමින් සාකච්ඡාවට භාජනය කළ හැකිවන පරිදි ක්‍රියාවලි සැලසුම් කිරීමේ මූලධර්මයන් ය. ව්‍යාවර්තන ක්‍රියාදාමයේ ද්විත්ව අවධාරණය වන 'පුද්ගලයා බලගැන්වුම' සහ 'අන්‍යයන් හා සම්බන්ධතා ගොඩනැගීම' උක්ත වර්ග තුනේ ඇතුළත් හැකියාවන් සහ තාක්ෂණවල කේන්ද්‍රීයව පවතින බව මෙම ලේඛකයා අවසානයේ දී ප්‍රකාශ කරයි.

*ෆෙඩ්රික් ග්ලාසල් සහ රූඩි බොරේච්* යන ලේඛකයෝ කණ්ඩායම් සහ සංවිධාන අතර ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශ පිළිබඳව සාකච්ඡා කරති. ඔවුහු කණ්ඩායම් අතර සහයෝගීතා මට්ටම් පහක් හඳුනා ගනිති. ඒවා නම්, පුද්ගල සාමාජික මට්ටම, සංචිත මට්ටම, අන්තර් ක්‍රියාකාරී මට්ටම, ක්‍රියාදාම මට්ටම සහ කණ්ඩායමේ බාහිර සම්බන්ධතා එහි පරිසරය කෙරේ බලපාන මට්ටමයි. කණ්ඩායම් ඇතුළත පවතින ගැටුම් විසඳීම සඳහා සෑම මට්ටමක ම ප්‍රවේශ මෙම රචකයෝ ඉදිරිපත් කරති. විශේෂයෙන් ම පුද්ගල භූමිකා සහ කණ්ඩායම් වශයෙන් තීරණ ගැනීමේ ක්‍රම සහ කණ්ඩායම් සංවර්ධන මට්ටම ගැන නිවැරදි විනිශ්චය ගැන යළි සිතා බැලීම සුදුසු යැයි ඔවුහු යෝජනා කරති. මෙම ලේඛකයන් පවසන පරිදි, ගැටුම්වල විභව ශක්තිය සහ ගැටුම් කළමනාකරණ ප්‍රස්තා යන කරුණු දෙක ගැන අවබෝධ කරගැන්මට කණ්ඩායම්වලට හැකියාව ලබාදෙන්නේ නම්, ගැටුම්වල ආරම්භයේදීම ඒවා හඳුනාගැන්මටත්, අර්ථදායී අයුරින් ඒවාට ප්‍රවේශවීමටත් කණ්ඩායම්වලට හැකියාව ලැබෙයි.



© 2006 Berghof Research Center for Constructive Conflict Management

"ඔබ කතා කරන තාක් ඔබට වෙඩි තබන්නට නො හැකිය" යන ජනප්‍රිය කියමන අනුව යමින් සාකච්ඡාව ගැටුම් අර්ථදායී ලෙස විසඳා ගැනීමේ සම්භාව්‍ය මාර්ගයක් ලෙස *නෝර්බට් රෝපස්* පිළිගනී. සම්භාව්‍ය රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍රයෙහි දූරදර්ශී වූ සම්බන්ධතා කළමනාකරණයේ දී සාකච්ඡා සංවාද මෙහෙයවීමේ ශක්‍යතාව මූලික භාවිතාවක් වශයෙන් හඳුනාගෙන ඇත. එහෙත් බලකාමී දේශපාලන හේතුවෙන් නිල රාජ්‍යතාන්ත්‍රික උපායක් වශයෙන් සාකච්ඡා හැකියාව පසුබිමට තල්ලු වී ඇත. මීට එරෙහිව නිල නොවන II පථයේ රාජ්‍යතාන්ත්‍රික නියෝජනයන්වල දී අන්‍යොන්‍ය අවබෝධය, ඍජු සම්බන්ධතා සහ සන්නිවේදනය කරළියට ගෙන ඇත. වාර්ගික දේශපාලන තත්ත්වයන් තුළ විශේෂයෙන් සමාජයන් තුළ ප්‍රචණ්ඩකාරී විය හැකි ගැටුම් හෝ සන්නද්ධමය ගැටුම් විසඳීම සඳහා හෝ ඒ සඳහා කළමනාකරණයක් සඳහා දායකත්වය ලබාගැනීමට ඉලක්ක කර ඇති සාකච්ඡාමය ව්‍යාපෘති රැසක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ව්‍යාපෘති රැසක් බාහිර පාර්ශ්වකරුවන්ගේ උදව් ඇතිව, එනම් තෙවැනි පාර්ශ්වයක මැදිහත්වීම යටතේ සිදු කෙරේ. මෙහිදී උත්කෘෂ්ට සාකච්ඡා විධි පිළිබඳ පුළුල් විමසුමක් සපයන අතරම බොහෝ සාකච්ඡාමය ක්‍රියාදාමයන්හි පවතින මූලික ලක්ෂණ ලේඛකයා හඳුනා ගනී. සාර්ථකත්වය මැන ගැනීමේ නිර්ණායකයන් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වන ගැටුම් හැසිරවීමේ විවිධාකාර ප්‍රවේශ පිළිබඳ සන්දර්භය තුළ ඔහු සංවාදය පිළිබඳව සාකච්ඡා කරයි. සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සාකච්ඡාමය ව්‍යාපෘතියකට කළ හැකි විශාලතම සංකල්පමය දායකත්වය වන්නේ සංවාදය පදනම් වූ වාදප්‍රිය සංස්කෘතියක් බිහි කිරීම බව ඔහු නිගමනය කරයි. එය දේශපාලන සංස්කෘතියේ මූලික පරාමිතිය විය යුතුය.



සිව්වන භාගයේ දී ගැටුම් ව්‍යාවර්තනය සහ සාමය ගොඩනැගීම සඳහා අවශ්‍යවන පූර්ව කොන්දේසි ලෙස ව්‍යූහාත්මක ප්‍රතිසංස්කරණ, ආයතන ගොඩනැගුම සහ ප්‍රචණ්ඩත්ව පාලනය යන කරුණු ගැන ලේඛකයෝ අවධානය යොමු කරති. රාජ්‍ය හා සිවිල් ක්‍රියාකාරීන් ගන්නා ප්‍රධාන ප්‍රවේශ ඔවුහු හකුළා දක්වති.

යුද්ධයෙන් ඇළලී ගිය ප්‍රදේශවල ව්‍යාවර්තනය සඳහා අවශ්‍ය වන රාජ්‍ය ප්‍රතිසංස්කරණයේ වැදගත්කම *ගුන්තෙර් බැච්ලර්* ගවේෂණ කරයි. සාමකාමී ගැටුම් නිරාකරණය සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිසංස්කරණය, විශේෂයෙන් ම දුර්වල රාජ්‍යයන් සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් බව ඔහු පවසයි. ආරක්ෂාව සහිත 'කෙම්බිම්' තහවුරු කිරීම සඳහා ගනු ලබන ප්‍රයත්නයන්ට ජනතාවගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය බවට ඔහු වාද කරයි. ගැටුම් ව්‍යාවර්තනය සහ රාජ්‍ය ප්‍රතිසංස්කරණය සඳහා වන ක්‍රමෝපායන් තුනක් ඔහු ගෙනහැර දක්වයි. සමාජ සහ දේශපාලන ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන සහභාගික ක්‍රමෝපායන් පළමුවැන්නෙහි අඩංගු වෙයි (ප්‍රජාතන්ත්‍රීකරණය, සිවිල් සමාජය ශක්තිමත් කිරීම, සංවාද පදනම් වූ ප්‍රවේශය). ශක්තිමත් සමාජයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය වන සෑම ආකාරයක ම ආයතන ගොඩනැගීම සහ ආයතන ප්‍රතිසංස්කරණ වැනි අංග දෙවැන්නට ඇතුළත් වෙයි (ෆෙඩරල්කරණය, විමධ්‍යගතකරණය, ව්‍යවස්ථාව සහ අධිකරණ ක්‍රියාදාමය). තෙවැන්නෙන් සාකච්ඡා කෙරෙන්නේ ආරක්ෂක අවශ්‍යතා සහ ආරක්ෂක ඉල්ලුමය (මානව හිමිකම්, මානව ආරක්ෂාව හා හමුදාමය තර්ජනවලින් තොර බව). රචකයා නිගමනය කරන පරිදි, ස්ථාවර සාමයක් සඳහා ප්‍රජාතන්ත්‍රවාදය අත්‍යවශ්‍ය කොන්දේසියක් යයි විද්වතුන් අතර පුළුල් එකඟතාවක් පවතී. මෙය ප්‍රමාණවත් කොන්දේසියක් ද යන්න හා සමාජයක් ප්‍රචණ්ඩත්වයෙන් මුදාගැනීම සඳහා පරිසරය සකස් කිරීමට

© 2006 Berghof Research Center for Constructive Conflict Management

අවශ්‍ය වන ව්‍යවස්ථාව පිළියෙල කිරීම සඳහා මීට කුමන සාධක එක් කළ යුතු ද යන කරුණු වටා වර්තමානයේ වාද විවාද පවතී. එමෙන් ම විවෘත න්‍යායාත්මක ප්‍රශ්න රැසක් ඉතිරිව පවතී; ඒවා නම්, 'ප්‍රජාතන්ත්‍රවාදී සාමය' යනුවෙන් යමක් තිබේද?, එසේ නම්, ඒ සඳහා වැදගත්වන සාධක කවරේද? " වාදප්‍රිය සංස්කෘතියක්" ස්ථාපිත කරන්නේ කෙසේද? හෝ රැඩිකල් සංක්‍රාන්තිමය සමයක එවැන්නක් රඳවාගන්නේ කෙසේද? හෝ වේගයෙන් වෙනස්වන සමාජයක එය රඳවා ගන්නේ කෙසේද?

භීෂණය පාලනය කිරීම සහ සාමය ගොඩනැගීම සඳහා වන ශක්‍යතා වර්ධනය කර ගැනීම, සාම සාධනයේ දී වැදගත් වන අයුරු *විබ්කේ හැන්සන්, ඔලිවර් රම්ස්බොතම්* සහ *ටොම් වුඩ්හවුස්* විදහා දක්වති. එහි භාවිතාව නිසි පරිදි ප්‍රතිශෝධනයට භාජනය වනතාක් සාම සාධනය වැදගත් මෙවලමක් සේ භාවිත කළ හැකි යැයි ලේඛකයෝ පවසති. ගැටුමක වෙනස්වන පරිසරයන්ට ගැලපෙන පරිදි සාම සාධනය පැවැතිය යුතු බවට නව චින්තනයක් බිහිවී ඇති අතර සාමය ගොඩනැගීමේ ශක්‍යතාවන් ශක්තිමත් කරන අතර ම මූලික වශයෙන් බලගැන්වීමේ බලය ශක්තිමත් කිරීම අවධාරණය කරති. නව දෘෂ්ටිය විසින් භීෂණය පාලනය කිරීමේ ද්විත්ව අරමුණු පෙරදැරි කරගන්නා අතර, ඊට සමාන්තරව එකඟතාවන් පවත්වා ගැනීම හා සහයෝගිතා සම්බන්ධතා යළි ගොඩනගා ගැන්ම ද කළ යුතුය. දැනට ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ වර්ධනය වී ඇති ප්‍රවේශයන් සාම සාධන භාවිතාවන් හා දැඩිව ඒකාබද්ධ වුවහොත් පමණක් මෙම ද්විත්ව අරමුණුවලට ළඟාවිය හැකි යැයි රචකයෝ පවසති. අර්බුද විසඳාලීමේ න්‍යායය විෂයයෙහි වර්ධනය වී ඇති දැනුම සාම සාධනයේ නියැලී සිටින්නන්ට වැදගත් වන්නේ කිනම් අවස්ථාවල ද යන්නත්, සාම සාධනයේ අනාගත අවශ්‍යතා පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දීම හා භාවිතය පිළිබඳ දෘෂ්ටිකෝණත් මෙම ලිපිය මගින් වැඩි දුරටත් පෙන්වා දෙයි.

ජනවාර්ගික දේශපාලන ගැටුම් ව්‍යාවර්තනයේ දී ප්‍රවෘත්ති මාධ්‍යයේ කාර්යභාරය *ඩුසාන් රෙල්ජික්* විශ්ලේෂණය කරයි. ජාතික අනන්‍යතා ස්ථාපනය සඳහා ප්‍රවෘත්ති මාධ්‍ය බොහෝ විට දායක වෙයි. ජනවාර්ගික වශයෙන් බෙදී සිටින සමාජවල, මාධ්‍ය මගින් එකඟ බව පිළිබඳ හැඟීම් උත්සන්න කළ හැකි අතර එමගින් ජනවර්ග අතර ඝෘණාත්මක ආවෘත්තාකාර සන්නිවේදන ජාලයන් ඇති වී, අවසානයේ ප්‍රචණ්ඩත්වය කරා එය වර්ධනය විය හැකිය. සාමය ගොඩනැගීම සඳහා අවශ්‍ය කෙරෙන අන්දමට ජනවාර්ගික දේශපාලන ගැටුම් වාර්තා කිරීමේ විවිධ අංශ පිළිබඳව මාධ්‍යවේදීන් සහ සාම පර්යේෂකයන් විසින් කරනු ලැබ ඇති විවිධාකාර පර්යේෂණ සහ යෝජනා මෙම ලේඛකයා ඉදිරිපත් කරයි. අර්බුදයේ අවසාන ඉලක්කය සඳහා ධනාත්මක වශයෙන් බලපෑම් ඇති කිරීමට මාධ්‍යවේදීන්ට ප්‍රායෝගික වශයෙන් ඇත්තේ ඉතා අඩු ඉඩකඩක් බව ඔහු පෙන්වා දෙන්නේ මූලික වශයෙන් ප්‍රවෘත්ති මාධ්‍ය බලාධිකාරයේ මෙවලමක් වශයෙන් සේවය කරන හෙයිනි. කෙසේ වෙතත්, මාධ්‍යයේ බලපෑම විස්තර කිරීම සඳහා ඔහු මූලික ආදර්ශයක් සහිත කෘතියක් නිර්මාණය කර ඇත. සමාජයක ජනමාධ්‍යයේ දේශපාලන සන්නිවේදන බලපෑම බොහෝ විට හුදු දේශපාලන සහ ආර්ථිකය මත රඳා පවතින්නේය. මාධ්‍යවේදීන්ගේ පුහුණුව සහ හැකියාවන් මත ජනතාව තුළ පවතින දේශපාලන ආකල්ප මත රඳා පවතින්නේය යන උපකල්පනයන් භාවිත කරමින් මෙම ආකෘතිය නිර්මාණය කර ඇත. මෙම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡාවකින් සහ ස්ථාවර සහ සංක්‍රාන්තික ප්‍රජාතාන්ත්‍රීය රටවල ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රතිසංස්කරණය සඳහා යුරෝපීය මට්ටමේ ප්‍රයත්න පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කරමින් මෙම ලිපිය අවසන් වෙයි.



© 2006 Berghof Research Center for Constructive Conflict Management

සාමය ගොඩනැගීමේ ව්‍යුහාත්මක අංශ සම්බන්ධ සංවර්ධන සහායෙහි කාර්යභාරය *ක්‍රිස්ටින් විගඩන්* සහ *බෙනඩික් කෝර්ෆ්* විස්තර කරති. ගැටුම් ව්‍යාවර්තනය සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමු කරමින් සංවර්ධන ආධාර සැපයීමේ ක්ෂේත්‍රය පිළිබඳව, විශේෂයෙන් ම එහි න්‍යායාත්මක සංකල්පයන් සහ ශක්‍යතා වර්ධනය කිරීමේ ප්‍රවේශයන්හි ප්‍රායෝගික අත්දැකීම් මෙම ලිපිය මගින් විදහා දක්වෙයි. සංවර්ධන ප්‍රතිපත්තීන් හි මෑතක සිදු වූ කතිකාව පිළිබඳව මෙම ලේඛකයින් වැඩි අවධානයක් යොමු කරන අතර ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රය තුළ බලගැන්වුම් ප්‍රවේශය විමසුමට භාජනය කෙරේ. ගැටුම් ව්‍යාවර්තනය, හැකියා වර්ධනය සහ සහභාගීත්වය අතර සම්බන්ධතාව ඔවුන් සාකච්ඡාවට භාජනය කරන අතර ප්‍රජා මට්ටමින් පොදු සහභාගීත්ව ප්‍රවේශයන්හි ඇති විභවශක්තිය, ග්‍රාමීය මට්ටමින් ගැටුම් ව්‍යාවර්තනය සඳහා ඒවාහි ඇති බලපෑම පිළිබඳව ඔවුහු විවේචනාත්මකව සාකච්ඡා කරති. ඔවුන්ගේ සොයාගැනීම් අතර එක් සංසිද්ධියක් වන්නේ සංවර්ධන ඒජන්සි ක්‍රියාත්මකවන්නේ ඉතා පටු පරාසයක වන අතර ඒවා විවිධාකාර උභතෝකෝටික සහ අවිනිශ්චිතභාවයන්ට මුහුණදෙමින් පවතින බවත් මේ නිසා සාර්ථකත්වයට බාධා ඇතිවිය හැකි බවත් ය. කෙසේ නමුත්, දේශීය ප්‍රජාව සංවර්ධනය කිරීමටත් අන්තර්ග්‍රාහී පුරවැසි ක්‍රමයක් සංවර්ධනය කරන්නට එයින් ඉඩකඩ සැලසේනම් බලගැන්වුම් ක්‍රියාවලීන් ගැටුම් ව්‍යාවර්තනය සඳහා දායක වනු ඇත.

මෙම අත්පොතේ පස්වැනි භාගයෙන්, පශ්චාත් යුද්ධ සහ යුද්ධ-ග්‍රස්ත (wartorn) සමාජවල ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය සහ සන්ධානගත සඳහා අභියෝග කරන්නක් ලෙස ගැටුම් ව්‍යාවර්තනය අවධාරණය කෙරෙයි.



යුද්ධය පවතින සමාජවල ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය සහ යළි ඒකාබද්ධ කිරීම සඳහා වන ගැටලු පිළිබඳ පුළුල් දැක්මක් *මාර්ටිනා ෆිෂර්* ගේ ලිපියෙන් සැපයේ. පශ්චාත් යුද්ධ තත්ත්වයන් තුළ ප්‍රතිසංස්කරණය ඉතා අවිනිශ්චිත මෙන් ම විසංවාදී සංකල්පයක් වීමට පුළුවනඃ ඇතැම් ක්‍රියාකාරීන් විසින් ප්‍රතිසංස්කරණය වැදගත් ලෙස දකින අතර ඇතැමෙකු විසින් සමාජය ප්‍රතිසංස්කරණය කළ හැකිය හෝ කළ යුතුය යන්න ප්‍රතික්ෂේප කරනු ලැබේ. අනාථවූවන් සහ අවතැන්වූවන් යළි සමාජය හා බද්ධ කිරීම ගැටුම් ව්‍යාවර්තනයේ ප්‍රධාන අභියෝගයක් මෙන්ම පූර්ව කොන්දේසියක් යැයි ලේඛකයා තර්ක කරයි. බාහිර ක්‍රියාකාරීන් සපයන උදව් සහ මැදිහත්වීම්, ද්‍රව්‍යමය ප්‍රතිසංස්කරණ වන නිවාස හා යටිතල පහසුකම්වලට පමණක් සීමාවන අතර ජන සමාජ යළි ගොඩනැගීමේ අවශ්‍යතාව අමතක කර ඇත. ප්‍රතිසංස්කරණයේ සිට අර්ථාන්විත ගැටුම් ව්‍යාවර්තනයකට සහ සාමය ගොඩනැගීමකට යාමට නම් සංවර්ධන ප්‍රවේශ ආර්ථිකමය සංකල්ප සහ දේශීය ක්‍රියාකාරීන් හා සිවිල් සමාජ බලගැන්වුම, සාම අධ්‍යාපනය සහ සමාජ වැඩ කටයුතු යන සියලුම අංග ඒකාබද්ධ කෙරෙන සාමූහික වැඩ පිළිවෙලක් අවශ්‍යය. තෙවැනි පාර්ශ්වයක මැදිහත්වීම සප්‍රයෝජනය වීමට නම් සම්බන්ධීකරණ කටයුතු අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ධනාත්මක සහ ඍණාත්මක පාඩම් බෝල්කන් ජාතීන්ගෙන් ලබාගත හැකිය.

ප්‍රචණ්ඩත්වයේ ඵල විපාක සම්බන්ධයෙන් එහි මානසික පරිමාණය අනුව කරුණු විමසුමට ලක්කළ යුතු යැයි ලතින් ඇමරිකාවේ සහ බෝල්කන් හි සිය ප්‍රායෝගික අත්දැකීම් ඇසුරෙන් *ඩේවිඩ් බෙකර්* විස්තර කරයි. මානසික භ්‍රාන්තිය (trauma) පිළිබඳ න්‍යායයන් සාකච්ඡාවට භාජනය කරන මෙම පරිච්ඡේදය මානසික භ්‍රාන්තිය පිළිබඳ සංකල්පය, ඒවා සම්භවය ලබන විශේෂිත දේශපාලන

© 2006 Berghof Research Center for Constructive Conflict Management

හා සංස්කෘතික සන්දර්භය අනුව නිරතුරුව ප්‍රතිසම්පාදනය විය යුතුයයි තර්ක කරයි. විශේෂයෙන් මානසික භ්‍රාන්තිය ගතිකමය අන්තර් මනෝභාවයන් සම්බන්ධයෙන් ගත් කල, මෙහි මූලික සාධකයක් වන්නේ මානසික විභින්නතාව බවත්, එය පිටුදැකිය හැක්කේ සිදුවී ඇති විනාශය පිළිගනිමින් සහ හඳුනා ගනිමින් ඇති වන ඉතා කිට්ටු සබඳතාවයක් තුළ සංකේතාත්මකභාවය සඳහා ඇති ඉඩකඩ ලබාදීම මගින් බවත් තර්ක කෙරේ. අර්බුද පවතින ක්ෂේත්‍රයක මානසික ආතතීන් පිළිබඳ කටයුතු, ඒකාබද්ධ ප්‍රවේශයක කොටසක් විය යුතු බවත්, එ මගින් මනෝවිද්‍යාත්මක, අධ්‍යාපනික සහ ආර්ථිකමය පරිමාණයන් ආවරණය විය යුතු බවත් ය.

සන්නද්ධ ගැටුමකට පසු අසාධාරණකම් පරීක්ෂණයට භාජන කිරීමේ සහ නිවැරදි කිරීමේ විවිධ ප්‍රවේශ *ගුනර් දෙයිසන්* සිය ලිපියෙන් සොයා බලයි. විනිශ්චය සභා, ප්‍රජා අධිකරණ සහ සත්‍යය සෙවීමේ කොමිසම් වැනි ආයතනවල ඇති අවදානම සහ විභව්‍යතා පිළිබඳ එය විමර්ශනයට ලක් කරයි. එසේම සමාව, වන්දි ගෙවීම් සහ සමගි සන්ධානය සඳහා පහළ ම මට්ටමෙන් ඇති වන මුලපිරීම් ගැටුම් ව්‍යාවර්තනයකට කෙසේ දායක විය හැකි දැයි ලේකඛයා මෙහි දී සාකච්ඡා කරයි. යුද්ධයෙන් ඇළලී ගිය සමාජවල ක්‍රියාකාරකම් වෙනස්වන බල සබඳතා සහ ක්‍රියාකාරීවීමට ඇති සීමා පිළිබඳව ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් අවබෝධයෙන් සිටිය යුතු බව ඔහු පවසයි. අතීත සිද්ධි ගැන කටයුතු කිරීමේ දී තමන්ගේ ම වූ ප්‍රවේශයක් ගොඩනගා ගැනීම සඳහා දේශීය ක්‍රියාකාරීන් උනන්දු කිරීම තෙවැනි පාර්ශ්වයක මැදිහත්වීම මගින් ඉටුවීම සුදුසු ය. ඒ අනුව වර්තමානයේ මතුව එන අන්තර්ජාතික අපරාධ නීති පද්ධතිය දේශීය මුලපිරීම් සහ ආයතනවල කටයුතු නොසලකා බැහැර නොකළ යුතුය. අතීත අසාධාරණකම් සම්බන්ධයෙන් කටයුතු කිරීම කල් ගතවන ක්‍රියාවලියක් බවට පත්වෙමින් පවතී. ඒ නිසා එක් පරපුරක් තුළ ලබාගත හැකි අවබෝධ ප්‍රමාණය ඉතා සීමා සහිතය. සමගි සන්ධානය පශ්චාත් අර්බුද පුනරුත්ථාපනය සඳහා නීත්‍යානුකූල දර්ශනයක් වුවත් පැරණි සතුරන් මත එය බලෙන් පැටවිය නොහැකිය. පැරණි සැහැසිකම් පරීක්ෂණයට භාජනය කර අසාධාරණයන් ඉවත් නොකළහොත් ඊට ලක්වූවන් සමගි සන්ධානය ප්‍රතික්ෂේප කිරීමට ඉතා පැහැදිලි හේතු ඇත.

න්‍යායය, පර්යේෂණ හා සම්භාවිතාව ගැලපීමෙහි ලා පවතින අභියෝග සම්බන්ධයෙන් ගැඹුරට සාකච්ඡා කරන *කෙවින් ක්ලෙමන්ට්ස්* එවැනි ප්‍රවේශ අදාළ සියලු සමාජ වෙනස්කම් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන උපාය මාර්ග ද සපයයි. එහි දී මැදිහත්වීම සම්බන්ධයෙන් අප්‍රිකාව, කොකේසස් සහ ආසියාවෙන් උගත් සමහර පාඩම් මෙම පරිච්ඡේදයෙන් විදහා දැක්වේ. ගැටුමේ ව්‍යුහාත්මක මූලයන්, විශේෂයෙන් දේශපාලනමය සහ ආර්ථිකමය මූලයන්, ගැටුම් විශ්ලේෂණය සහ මැදිහත්වීම් ක්‍රියාවලි සැලසුම් කිරීමේ දී සාපේක්ෂ වශයෙන් ඌණ සංවර්ධිත තත්ත්වයක පවතීයයි ලේඛකයා තර්ක කරයි. බොහෝ ගැටුම්වල දෙවන පථයේ මැදිහත්වීම්, අවස්ථාමය හෝ ව්‍යුහාත්මක වෙනස්කම්වලට වඩා ආකල්පමය සහ චර්යාමය වෙනස්කම්වලට පදනම් වී ඇති බව මෙයින් අදහස් කෙරේ. මෙම තත්ත්වය ආපිට පෙරළා ආයතන සහ ක්‍රියාවලිවල ව්‍යාවර්තනය සඳහා වැඩි අවධානයක් යොමු නොකළ හොත් ස්ථාවර සාමකාමී සබඳතා ගොඩනැගීමට ඉතා අපහසු වනු ඇත.

බර්ගොෆ් *අත්පොතේ පළමු වැනි සංස්කරණයේ* ලිපි ලේඛනවලින් ඉදිරිපත් කෙරෙන්නේ කර්තෘ මණ්ඩලය අදහස් කළ මූලික තේමාය. මෙම වෙළුම නියෝජනය කරන්නේ තෝරාගත් ගැටලු



© 2006 Berghof Research Center for Constructive Conflict Management

සහ මාතෘකා කිහිපයක් පමණි. වැදගත් ගැටලු රාශියක් අනාගත සාකච්ඡාවන්ට සහ සවිස්තරාත්මක ගවේෂණය සඳහා ඉතිරි කෙරෙනු ඇත. අභියෝග කිහිපයක් තවමත් පවතී. ඒවා නම්,

- අර්බුද හා සම්බන්ධ කතිකාවෙන් මතු කෙරෙන එක් මුල් අභියෝගයක් වන්නේ ගැටුම් ව්‍යාවර්තනය සම්බන්ධයෙන් *බටහිර පදනම් කරගත් ප්‍රවේශ* බටහිර නොවූ සන්දර්භ සඳහා ආදේශ කරන්නේ කෙසේද යන්නයි. මේ ප්‍රශ්නය සම්බන්ධ කතිකාවත තවමත් පවතින නමුත් පවත්නේ ආරම්භක අවධියට වඩා වෙනස් අයුරකිනි. ඉතා දිගුකල් පවතින සමාජ ගැටුම් ඉස්මතුවීම බොහෝ සෙයින් බටහිර රාජ්‍යත්ව සංකල්පයට අදාළ ගෝලීයකරණය හා දැඩිව බැඳී පවතින බව පැහැදිලි වී ඇති අතර එහි ප්‍රතිසංස්කරණය සඳහා එහි සංස්කෘතිකමය ප්‍රභවය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුව ඇත. එහෙත් ගැටුම් නිරාකරණයේ බොහෝ සාම්ප්‍රදායික ක්‍රම මගින් අර්ථාන්විත ව්‍යාවර්තනය තවත් ශක්තිමත් මෙන් ම තීව්‍ර කරන බව ද පැහැදිලි වී ඇත. එහෙත් ගැටලුව වන්නේ සාමය ගොඩනැගීමේ ප්‍රයත්නවල දී සංස්කෘතික විවිධත්වය කෙරේ ගරුත්වය අනෙක් සාධක වන සමාජ සහ සමාජභාව සමානාත්මතාව වැනි කරුණු හා සමබර වන්නේ කෙසේද යන්නයි.
- ගැටුම් ව්‍යාවර්තනයේ දී *සමාජභාවයේ සුවිශේෂි කාර්යභාරයන්* පිළිබඳවත්, එ මගින් සමාජභාවී සාධාරණත්වය ළඟාකර ගැනීම සම්බන්ධයෙනුත් කරුණු සොයා බැලීම සඳහා ගැඹුරු විශ්ලේෂණ හා මනසිකාරය අවශ්‍යය. ඩයනා ෆ්‍රැන්සිස් ඇයගේ පරිච්ඡේදයෙන් පවසා ඇති පරිදි සමාජභාව පරිමාණය සංස්කෘතික විවිධත්වය සහ බල අසමතුලිතතාවලට ඉතා සමීපව සම්බන්ධ වී ඇත. උදාහරණයක් වශයෙන් මේ සන්දර්භයෙහි ලා මතුවන වැදගත් ප්‍රශ්න අතර එකක් වන්නේ තීරණ ගැනීමේ ඒකාධිකාරය අඩු හෝ වැඩි වශයෙන් පිරිමින් සතුව පවතින, දැඩිව බෙදී වෙන්වී පවතින සමාජයක, 'සමාජභාවය පුරෝගාමීත්වයෙන්' ඉදිරියට ගමන් කරන්නේ කෙසේද යන්නයි. යුදමය කාල සීමාවක කාන්තාවන් අවාසනාවන්ත ලෙස ගෘහ මූලිකයන් බවට පත් වූ විට ඔවුහු සිය පවුලේ පැවැත්ම සඳහා වගකිය යුතු වෙති. එවැනි අවස්ථාවක කාන්තාවන්ගේ මෙම අලුත් සහ ක්‍රියාකාරී කාර්යභාරය ආරක්ෂා කරන්නේ කෙසේද යන්න ද ගැටලුවක් වී පවතී. සංවර්ධනය සහ මානව හිමිකම් අංශයෙන් ද ගත් කල කාන්තාවන්ගේ නීතිමය සහ සමාජ සමානාත්මතාව, දේශපාලන ක්‍රියාවලියේ දී ඔවුන්ගේ සහභාගීත්වය සහ ආත්මවිශ්වාසයෙන් යුතුව සිවිල් සමාජය හා කටයුතු කිරීම යන කාරණා ගැන ද අවධානය යොමු කළ යුතු වේ. එහෙත් සාමය ගොඩනැගීමේ දී සමාජභාවය පිළිබඳ සංවේදීතාවන් වර්ධනය කිරීමේ ප්‍රයත්නයන් මෙවැනි අරමුණුවලින් එපිටට යා යුතු අතර එහි ලා කාන්තාවන් ප්‍රචණ්ඩත්වයේ (සහ යුද්ධයේ) ගොදුරක් ලෙස හෝ පාර්ශ්වකරුවන් ලෙස විශේෂී තත්ත්වයන් හි ලා සැලකිය යුතු නැත. කාන්තාවන් හා පිරිමින් සතු අනන්‍යතාව පිළිබඳ ප්‍රශ්නත්, ගැටුමේ ප්‍රචණ්ඩත්වය සඳහා පුරුෂත්වය සහ ස්ත්‍රීත්වය යන සමාජ නිර්මිති කෙතෙක් දායක විය හැකිද, සහ භීෂණ සංස්කෘතීන් බිඳහෙළීම සඳහා එකී නිර්මිති හා සංකේතාත්මක වෙනස්කම් ඇති කිරීම සඳහා කුමක් කළ යුතු ද යන කරුණු පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. පශ්චාත් අර්බුද සාමය ගොඩනැගීමේ ක්‍රියාදාමයක නිරතව සිටින සංවිධානයකට මුහුණදීමට ඇති ප්‍රධාන අභියෝගයන් වන්නේ සමාජභාවයේ බලපෑම පිළිබඳ තක්සේරුවක් කළ හැකි විවිධාකාර මෙවලම් දියුණු කිරීම සහ පුරුෂාධිපත්‍යය මත ගොඩනැගුණු හමුදාකරණයක අනන්‍යතා රටා විදහා



© 2006 Berghof Research Center for Constructive Conflict Management

දැක්වීමත් ය. මෙම රටා පිටුදැකීම සඳහා අවශ්‍ය ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීමේ ක්‍රමවේද හඳුනා ගැනීම මෙම සන්දර්භයේ දී ඉතා වැදගත් වේ.

- පෝල් කොලියර්, ඩේවිඩ් මැලෝන් සහ අනෙකුත් රචකයන් "කෑදරකම සහ දුක් ගැනවිලි" පිළිබඳ කතිකාවත ආරම්භ කරමින් දේශපාලන ප්‍රචණ්ඩත්වය පිටුපස ඇති ආර්ථිකමය ආකල්පයන් ඉස්මතු කිරීමත් සමග 'දිගුකල් පවතින සමාජ ගැටුම්' පිළිබඳ සාම්ප්‍රදායික සංකල්ප අභියෝගයට ලක්විය. බොහෝ පරියන්ත කණ්ඩායම් ප්‍රචණ්ඩත්වය කරා යොමු වුණේ නීතිමය දේශපාලනමය දුක් ගැනවිලිවලට වඩා විහිත්න වූ ප්‍රබුද්ධයන් දැක් වූ ආර්ථිකමය උපායමාර්ග නිසා යැයි ඔවුහු වාද කළහ. මෙම විවාදය මගින් *සිවිල් යුද්ධයන්හි දේශපාලන ආර්ථිකයන්* පිළිබඳ නව අවධානයක් ඇති කළ අතර එමගින් ආර්ථික සාධක සහ අභ්‍යන්තර අර්බුද වර්ධනය වීම සහ අඩුවීම අතර ඇති සම්බන්ධතාව පිළිබඳ ඉතා වැදගත් ප්‍රශ්න රාශියක් මතු කෙරිණි.

- මෑතක බිහිවූ තවත් වැදගත් කාරණයක් වන්නේ රාජ්‍යාභ්‍යන්තර ගැටුම්වල *ආරක්ෂක පරිමාණය* පිළිබඳ උනන්දුවයි. යුද අවි හුවමාරුව, යුද ආධාර සහ සහයෝගීතාව, හමුදා සහ පොලිස් පාලනය පිළිබඳව විශ්ලේෂණය, කලක පටන් අර්බුද ව්‍යාවර්තනය සහ සාමය ගොඩනැගීම සම්බන්ධයෙන් කොන්කර තැබූ කාරණා විය. මේ තත්ත්වය මේ වන විට බෙහෙවින් වෙනස් වී ඇත. විශ්වාසය සහ ආරක්ෂාව ගොඩනැගීමේ පියවර (CSBMS), ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණය (SSR) සහ ඒ හා සමාන පියවර සම්බන්ධයෙන් මේ වන විට දැඩි එකඟතාවක් ගොඩනැගෙමින් පවතින අතර ගැටුම් ව්‍යාවර්තන ක්‍රියාවලිය සඳහා මෙම පියවර බොහෝ විට අත්‍යවශ්‍ය උපාංග විය හැකිය.



- අර්බුද විසඳාලීම සහ ව්‍යාවර්තනය අවශ්‍ය කෙරෙන තවත් ක්ෂේත්‍රයක් ලෙස බොහෝ කලක පටන් පැහැදිලිව සාකච්ඡාවට බඳුන් වූවක් වන්නේ *මානව හිමිකම් කටයුතුයි*. මෙය බරපතළ මානව හිමිකම් කඩකිරීම් බහුල වශයෙන් සිදුවන්නේ ප්‍රචණ්ඩකාරී ගැටුම් පවතින ප්‍රදේශවලය යන අත්දැකීම පදනම් කරගෙනයි. කෙසේ වෙතත්, මානව හිමිකම් සහ ගැටුම් ව්‍යාවර්තන කටයුතු අතර පැහැදිලි වෙනස්කම් ඇති නිසා මෙම කරුණු දෙකෙන් එකකට වැඩි අනුබලයක් දුන් විට අවශ්‍යයෙන් ම අනෙකට අනුබලයක් ඉබේ ම නොලැබේ. අවම වශයෙන් එය මෙම ද්විභෙදනය සමහර ගැටුම් සහිත ස්ථානවල අසමමිතික ගැටුම් ව්‍යාවර්තනය සඳහා එකිනෙකට වෙනස් දෙයාකාර ප්‍රවේශයක් හා සම්බන්ධ වෙයිඃ එනම්, ඕනෑම සාකච්ඡාමය අවස්ථාවක දී අඩු සුජාත බවකින් යුත් පාර්ශ්වය සමාන මට්ටමින් සහභාගී වීමේ අවස්ථාව 'හිමිකර ගැනීම' අවධාරණය කෙරෙන "තත්ත්වාරෝපිත ප්‍රවේශය" සහ සමාජ විපර්යාසයේ බලපෑම හා ඊට අදාළ ක්‍රියාවලිය බලගන්වනු සඳහා පිළිගැනීම හා අර්ථාන්විත ගිවිසුම වශයෙන් සමාන තත්ත්වය අවධාරණය කරන "ව්‍යාවර්තනීය ප්‍රවේශය" වශයෙනි.

- ගැටුම් ව්‍යාවර්තනය හා අන්තර්ජාතික සබඳතා ක්ෂේත්‍රයන් තුළ පැවති පොදු පර්යේෂණ හා ප්‍රායෝගික අංශයක් වන්නේ *සාම ක්‍රියාදාමවල* ගතිකත්වය හා එහි නිර්මාණයයි. සමාජ ගැටුම නිම කිරීම සඳහා සටන් විරාමයක සිට ස්ථාවර සාම ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම දක්වා වන දිගු ක්‍රියාවලියක දී මෙම මාතෘකාව වඩාත් ආකර්ශණීය වේ. කාලාන්තරව පවතින සමාජ ගැටුම් නිම කිරීම සඳහා වන සාම ක්‍රියාවලි බොහෝ කල් ගතවන අතර එය විවිධාකාර වූ බාධක සහ යළි

© 2006 Berghof Research Center for Constructive Conflict Management

සටන් ඇවිලීමේ අදියරවලින් යුක්ත වෙයි. එහි 'මාර්ග සිතියම්' සහ 'බහු-පියවර', 'බහු-ගැටලු' සහ 'බහුපථ' ප්‍රවේශ වැනි විවිධ ක්‍රියාවලි භාවිතය සඳහා ක්‍රියාකාරීන් උනන්දු කෙරෙයි.

- අවසාන වශයෙන් ගත් කල ගැටුම් ව්‍යාවර්තනය දැනට පවතින ලෝක සම්මත ප්‍රවණතා සහ මතවාදවලින් වෙන් කර ස්වාධීනව ගත නොහැකිය. මේ සඳහා ගත හැකි වැදගත් නැවතීමේ ලකුණ වන්නේ 2001 සැප්තැම්බර් 11 දින සිද්ධියයි. මේ නිසා ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් යටතේ ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍යය නව අධිපතිවාදී ලෝක සම්මතයක් සඳහා යත්න දරන අතර, එ මගින් බහුත්වතාවාදය සහ සාමකාමී අර්බුද නිරාකරණය පිළිබඳ මූලික මත ගැන ප්‍රශ්න කරයි. ගැටුම් ව්‍යාවර්තනයේ අනාගතයඃ මෙය අර්ථ දක්වෙන්නේ කෙසේද? මෙම ප්‍රවේශ, සංකල්ප, ක්‍රමවේද සහ භාවිතාවන් දැනට මතුවෙමින් පවතින ආධිපත්‍යවාදී විප්ලවය හා ඒකාබද්ධ වේද?, නැතහොත් ඒවා දෙවන ලෝක යුද්ධයෙන් පසුව ගැටුම් සංවර්ධන කිරීමේලා, ලබාදුන් ජයග්‍රහණ හුවා දැක්වීම සඳහා දායක වේ ද?

තවත් බොහෝ කාරණා රැසක් අතර මෙම ප්‍රශ්න ද *බර්ගොෆ් අත්පොතේ* අනාගත වෙළුමක ඉලක්කගත අරමුණු වනු ඇත. පෙර මෙන්ම අනාගත සංස්කරණ ද සැකසෙනු ඇත්තේ ද්වි-පථික ක්‍රියාවලියක් වශයෙනි. මුලින්ම ලිපි වෙබ් අඩවියේ පළ කෙරෙන අතර දෙවනුව ඒවා *බර්ගොෆ් අත්පොතේ සාකච්ඡාමය ප්‍රකාශන මාලාව* වශයෙන් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. මේ හා සම්බන්ධයෙන් ඇති උනන්දුව හා ප්‍රතිපෝෂණය පවතිනු ඇතැයි අප විශ්වාස කරන අතර අපට නිරන්තරයෙන් ප්‍රතිචාර දක්වන ලෙස සහ/හෝ අනාගත සාකච්ඡාවන්ට එක්වන ලෙස අපි අපේ සගයින්ට සහ පාඨකයින්ට ආයාචනා කරන්නෙමු.



© 2006 Berghof Research Center for Constructive Conflict Management